
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk


ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක්වූ පොසොන් අව අටවක පෝද 2022 ජුනි 21 අඟහරුවාදා BUDUSARANA TUESDAY JUNE 21, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 02 පත්‍රය, පිටු 12 ආරම්භය 1965 - 06 - 13

ආයාචිතභක්ත ජාතක කතාවෙනි

# අත්දැකීමක්



අජාන් බ්‍රහ්මවම්සෝ හිමි

මම තවමත් බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කරනවා. කොන්ක්‍රීට් අනමින්, ගඩොල් බඳිමින්, ගොඩනැඟිලි තනමින්, බරවැඩ කරනවා. සති කිහිපයකට පෙර ආරාමයේ කොන්ක්‍රීට් වැඩ කරමින් දහදිය වගුරමින් සිටි තැනට බොහෝම ලස්සනට හැඳ පැළඳ සිටි කාන්තාවක් ආවා. ඇය ශ්‍රී ලංකාවෙන් පැමිණි දායිකාවක්. ඇය මා පුද්ගලිකව දැන හැඳින සිටියේ නැහැ. මේ වෙලාවේ මම බොහෝ ම අපිරිසුදුවට හිටියා. මේ කාන්තාව මා බැහැදැක "නායක හාමුදුරුවන් කොහිදැයි" මගෙන් ඇසුවා, 'නායක හාමුදුරුවන් ඉක්මනින් දාන ශාලාවට ඒවි' මම උත්තර දුන්නාම ඇය දාන ශාලාවට ගියා. ඉන්පසුව මම ඉක්මනට මගේ කුටියට ගොස් නා, පිරිසුදුව අලුත් සිවුරක් හැඳ දාන ශාලාවට ආවා.

ඇය මා සමඟ බුදු දහම, භාවනාව ආදි නොයෙකුත් දේ ගැන කතා කළා. ඇය බොහෝ ම සතුටු වී සිටි විත්තිය පෙනුණා.

"මේ වන සෙනසුන ඉතා සුන්දරයි. ඔබ වහන්සේගේ කතාව ද මගේ සිත් ගත්තා. ඒත් කනගාටුවට කාරණාවක් ද තිබෙනවා. මේ ආරාමයේ සමහර හාමුදුරුවන් බොහෝ ම දුප්පත් විදිහට හැඳ පැළඳ සිටින, ඉතා අපිරිසුදුවට ඉන්න පිරිසක්. මා මෙහි ආ විට එවැනි භික්ෂුවක් මට මුණ ගැසුණා" යැයි ඇය කිව්වා.

" බොහොම හොඳයි. මම ඒ භික්ෂුවට මේ කාරණය ගැන අවවාද දෙන්නම්" යැයි මම ඇයට කිව්වා."ඒ මොකද කිව්වොත් ඒ අපිරිසුදු හාමුදුරුවෝ වෙන කවුරුවත් නොවෙයි. මා නිසයි."

මෙය ඉතා යහපත් දෙයක්. ඒ මොකද කිව්වොත්, අපේ අල්පේච්ඡභාවය, චාම්කම නිසා මේ නායකයා ම ද, මේ ගෝලයා ද කියා හඳුනාගන්න බැරි සමානකමක් අප අතර තිබෙනවා. මුදල් භාවිතයක් නැතිවිට, යස ඉසුරු අත්පත් කර නොගත්විට සියලු භික්ෂූන් එක සමානයි. ඇඳුමෙන්, යස ඉසුරෙන්, උස් පහත්කමින් පේන්නෙත් නැහැ.

මුදල් අතේ ගැවසෙන විට සමාජය තුළ ධනවත් එසේත් නැතිනම් ප්‍රභූ පන්තියක් ඇතිවෙනවා. විසල් නිවාස,සුඛෝපභෝගී යාන වාහන පරිහරණය කරනවා. ප්‍රභූවරුන් හා දිළින්දන් ඇතිවෙනවා. මෙසේ දෙකොටසක් ඇති වීමෙන් භේදයක්,වෙන් කිරීමක් සිදු වෙනවා. මෙය සමාජයේ එකමුතුකමට, යහපැවැත්මට බාධාවක්, භික්ෂූන් වහන්සේ අතේ මුදල් නොමැතිවීම නිසා උන්වහන්සේ අතර උස් පහත් භේදයක් ඇති වන්නේ නෑ. කවුරුත් එක සමානයි.

පරිවර්තනය
**සමරසිංහ ගුණසේකර**



# පිහිට පිළිසරණ අහිමි වන හැටි



කෙනෙක් අවශ්‍ය දේටත් කිපෙති. කෙනෙක් අනවශ්‍ය දේටත් කිපෙති. එසේ අවශ්‍ය තැන හෝ අනවශ්‍ය තැන හෝ ක්‍රෝධ සහගත වීම ධර්මයට අනුව ජීවත්වන පුද්ගලයාගේ පුරුද්දක් නොවේ. ඒ ඔහු ක්‍රෝධ සහිත බවේ බරපතළ විපාක හොඳින් දන්නා නිසා ය.

තමන්ගේ ම දෑතින් තමන්ගේ ම ගෙල සිර කර ගැනීමක් බඳු ක්‍රෝධ සහගත බව දුරු නොකළහොත් සිදුවන විනාශය තමන් ද වනසා අනුන් ද වනසාලයි. ඒ, මේ ආකාරයෙනි.

කිපෙන ගති ඇති, ක්‍රෝධ සිත් ඇති තැනැත්තා සැම විට ම ක්‍රෝධයෙන් යුතු සිත් ඇති වීම නිසා එයින් පීඩා විඳියි. මුහුණෙහි ප්‍රසන්න භාවය නැතිවෙයි. ඒ වෙනුවට අප්‍රසන්න පෙනුමක් සහිත වූවේ වෙයි. දුර්වර්ණ බවට පත් වේ. දුර්වර්ණ ස්වභාවය නිසා ම කා අතරත් අප්‍රසාදයට ලක් වේ. කිසිවකු ප්‍රිය නො කරයි.

ක්‍රෝධයෙන් මත් වූ, දැඩි වූ සිතක් ඇති තැනැත්තා කයින් හා වචනයෙන් පව් සිදුකර ගනියි. ඒ නිසා ම ධනයෙන් පිරිහීමට ලක් වේ. අනුන්ගෙන් සිඟමන් යදිමින් ජීවත් වීමට සිදු වේ.

සතුරා කෙරෙහි වුවත් මෛත්‍රිය වඩනවා වෙනුවට ක්‍රෝධයෙන් සිත දූෂ්‍ය කොට ජීවත් වීම නිසා ක්‍රෝධ කරන්නා නින්දාවට ලක් වෙයි. තමා අවට සිටින ඥාතී මිත්‍රාදීන් පවා එම පුද්ගලයා අත හැර දමා යති. ක්‍රෝධ කිරීමේ අකුසලය නිසා ම මෙලොව කිසිවකුගේ පිළිසරණක් නැති හුදකලා වූ අසරණයකු බවට පත් වෙයි.

ක්‍රෝධය අනර්ථය පිණිස ම වේ. කිසිලෙසකින්වත් සිදුවන යහපතක් නම් නැත. ක්‍රෝධ කිරීම යනු කුසලය වෙනුවට අකුසලයට අත වැනීමකි. සිත තව තවත් ප්‍රකෝපයට පත් කරන්නකි. මානසික නිදහස, සැහැල්ලු බව නැති කරන්නකි. අපාය වැළඳ ගැනීමකි.

නිතර කිපෙන පුද්ගලයා කිසිම දෙයක සැබෑව අවබෝධ කර නොගනී. කිසිම දෙයක අර්ථය නො දනී. අධික කිපීම නිසා සමථ විදර්ශනා ධර්ම ද නො දනී. සමථ විදර්ශනා සඳහා වන මාර්ගය ද නො දනී. ඔහුට ඒ කිසිවක් නො පෙනෙන්නේ ය.

ක්‍රෝධයෙන් මඩනා ලද සිත් ඇත්තා යහපතක් යැයි සලකා සිදු කරන්නේ අයහපතක් ම ය. පසු ව ඒ ගැන කම්පා වන්නේ ය. ගින්නකින් දැවී ගිය අයෙකු සේ ය. තැවෙයි, පීඩා විඳියි. අවසානයේ දුකට පත් වේ.

ක්‍රෝධ කරන්නාට තමා කරන ක්‍රියාවන් පිළිබඳ ලජ්ජාව කියා දෙයක් නැත. ඒ සම්බන්ධව බියක් ද නැත. තමා කතා කරන වචන ශිෂ්ට ලෙස භාවිත නො කරයි. අසභ්‍ය, අසාර, අනර්ථ වචන ම කතා කරයි. එසේ ම, එලෙස ක්‍රෝධයෙන් යුතු තැනැත්තාට පිහිටක්, සරණක් හිමි නොවේ.

යහපත්, ධාර්මික ක්‍රියාවෙන් වෙන් ව, තැවීම පිණිස වන යම් ක්‍රියාවක් වේ නම්, කිපෙන්නා එවැනි ක්‍රියා කරයි. එබඳු ක්‍රියා යහපත් ක්‍රියා ලෙස ම සලකයි.

කිපෙන්නා පව පින නොහඳුනයි. එනිසා ම යම් මොහොතක තම පියා නැසීමට වුව යොමු වේ. මව නැසීමට වුව යොමු වේ. ක්‍රෝධය නිසා ම පුහුදුන් මිනිසුන් නැසීමට යොමු වේ. එවැනි පාපකාරී කාය දුෂ්චරිතයන් අවසානයේ මහා පව් කඳක් රැස් කර ගනියි.

ක්‍රෝධයෙන් යුතු සිත් ඇත්තා තමාට මෙලොව එළිය දැකීමට දායක වූ ප්‍රාණ දායිකාව (මව) ද නැසීමට නොපැකිළ වේ. හේ කෘතගුණ නො දන්නකු ලෙස ක්‍රෝධයෙන් සිත් දූෂ්‍ය කොට ජීවත් වේ.

වෛරයෙන් යුතු ක්‍රෝධ ගති ඇති තැනැත්තා තමා කෙරෙහි ම අතිශයින් සතුටු වෙයි. විවිධ අරමුණු කෙරෙහි ඇළුණු තැනැත්තා ක්‍රෝධය නිසා ම තමා වුව ද නසා ගැනීමට පෙළඹෙයි.

ක්‍රෝධයෙන් සිත පිරී ඇති, හොඳ නරක නො දැන මුළාවට පත් වූ තැනැත්තා කඩුවකින් වුව ද තමා නසා ගනියි. විෂ සහිත යමක් කෑමෙන් හෝ ජීවිතක්ෂයට පත් වෙයි. ගෙල වැල ලා ගෙන හෝ ජීවිතය නැති කර ගැනීමට පෙළඹෙයි. මහා ගල් පර්වතයකින් වුව ද පහළට පැන මිය යයි.

මේ ආදී වශයෙන් ක්‍රෝධ කරන්නන්, ක්‍රෝධය නිසා අනුන්ට පීඩා සිදු කරන්නා සේ ම, අවසානයේ ක්‍රෝධය නිසා තමා ද විනාශ කර ගන්නා ආකාරය මෙම සූත්‍රයේ මැනවින් දක්වා ඇත. එම නිසා ක්‍රෝධයෙන් සිත මුදා, මෛත්‍රියෙන් සිත පිරිසුදු කර ගැනීම සඳහා කළ යුතු පිළිවෙත අවසානයේ දී මෙසේ දක්වා ඇත.

"ඉතා යං කොධ රූපෙන
මච්චුපාසො ගුහාසයො
තා දමෙන සමුච්ජින්දො
පඤ්ඤ විරියෙන දිට්ඨියා"

එහි අදහසට අනුව මාරයාගේ ස්වරූපය අප තුළ ක්‍රියාත්මක වන්නේ ක්‍රෝධය පරිද්දෙනි. ක්‍රෝධය මාරයා වැනි ය යනු එහි සරල අදහස යි.

එම මාරයා හෙවත් ක්‍රෝධය සිතට ඒම නැති කළ හැක්කේ, වැළැක්විය හැක්කේ තම සිත තැන්පත් කර ගැනීමෙනි. සංවර හා සංසුන් කර ගැනීමෙනි. සිත දමනය කර ගැනීමෙනි. ක්‍රෝධයේ විපාකයන් දකිමින් නුවණැසින් ක්‍රියා කිරීමෙනි. උත්සාහයෙන් හා වීර්යයෙන් යුක්ත ව, සම්‍යක් දෘෂ්ටිය හෙවත් යහපත් දැකීමක් සහිත ව කටයුතු කිරීමෙනි. එසේ ම ක්‍රෝධ කිරීමෙන් ඇති වන ආදීනවයන් සැලකිල්ලට ගනිමින් එයින් වෙන් ව කටයුතු කිරීමෙනි.



බෝපැත්ත, ගැටහැත්ත
ශ්‍රී සෝමානන්ද ඉංග්‍රීසි මාධ්‍ය
මූලික පිරිවෙනේ
**රාස්සගල
චන්දකිත්ති හිමි**

# කෙලෙසද සෙට මරු නේති සිතන්නේ

**ප්‍රමා බව නම් සිහියෙන් ජීවත් නොවීමයි. එය අප්පමාද යන පදය තුළ අන්තර්ගත කොට ඇත. අප්පමාද නොවිය යුත්තේ ලබා ඇති කෙටි කාලීන ජීවිතයත් සමඟ ය. වර්තමානයේ මිනිසකුගේ පරම ආයුෂ කෙටි වී තිබේ. එහෙමත් කෙනෙක් හැත්තෑවක්, හැත්තෑපහක් ආයු වළඳනු ඇත.**

පමා වුවන් හා මළවුන් එක සමාන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. “පමාදෝ මච්චුනෝ පදං” මියගිය මිනිසෙක් තුළ ප්‍රාණ වායුව නොමැත. ජීවිතේන්ද්‍රිය නොමැත. උෂ්ණය නොමැත. හරියට වියළී ගිය දර කඩක් හා බඳු ය. එලෙස ම ප්‍රමාද වූ පුද්ගලයා සිහි මුළාවෙන් චක්ඛු, සෝත, ඝාණ,ජිව්හා කාය යන පංචේන්ද්‍රියන් පිනවීමට ම උත්සාහවත් වෙති. කම් සැපතෙහි ම ඇලෙති. ගැටෙති. ඒ මතම ඇලී ගැලී විනාශ වෙති. කුසල් දහම් කිරීමට තබා ඒ පිළිබඳ සිතීමක්වත් ඔවුන් තුළ නොමැත. මරණය වැළැක්වීමේ පිළිවෙතට යොමු නොවුණාවුන් ජාති, ජරා, ව්‍යාදී මරණාදී දුක් විඳිමින් ම මැරි මැරී නැවත නැවත සසර උපදිති.

අප ජීවත් වන්නේ පුංචි කාලයකි. එම පුංචි කාලයත් එදිනෙදා කටයුතු සඳහා වෙන් වීමේ දී අපට කම් සප විඳිමින් මේ බයංකර සසරෙහි සැපතක් ලැබිය හැකි ද? ඒ බව ප්‍රත්‍ය ශතකය තුළින් මැනවින් ඉදිරිපත් කොට ඇත.

මනුෂ්‍යයාට පරමායුෂ සියයෙක් වන්නේ ය. එයින් භාගයක් රාත්‍රීයේ දී ගෙවී යන්නේ ය. එයින් දෙභාගයක් බාල, මහලු, වයස් වන්නේ ය. අවශේෂ භාගය ද රෝග, පීඩා, වියෝ, දුක්, මරණ ආදියෙන් ගෙවී යන්නේ ය. එසේ හෙයින් චංචල වූ රළපතරක් මෙන් වසන සත්ත්වයාට සැපයක් නම් කොයින් ද?

ඉහත ශ්ලෝකයට අනුව තහවුරු වන්නේ සත්ත්වයාට පුංචි කාලයක් ගෙවීමට ඇති බැවින් එය සැපයක් සේ සිතීම අනුවණ ක්‍රියාවන් බවයි. අපට ඇති පුංචි කාලය තුළ සිහි නුවණින් ජීවත් වීමත්, පින් දහම් සිදු කර ගැනීමත් අත්‍යවශ්‍ය වේ. එවැනි ජීවිත ගත කරන්නන් ප්‍රමාද වීම යන වචනයට හසු නොවෙති. ඔවුන් තම ජීවිතය තුළ ලද ජයග්‍රහණය පිළිබඳ නිරන්තරයෙන් සතුටු වෙති. එසේ නොකොට දුර්ලභ ව ලද මේ ජීවිතය කම් සැපයට ම යොමු කොට හිස් මිනිසෙක් ලෙස ජීවත් වී මිය යන්නේ නම් ඔවුන් ප්‍රමාද වූ ගණයට අයත් වන අතර ම, ඔවුනට උරුම වන්නේ ද නැවත නැවත මැරි මැරී ඉපදී සසර දුක් විඳීමට ය.

ඔවුන් පිළිබඳ හිතෝපදේශය තුළ ද පැහැදිලි කිරීමක් කොට ඇත

නූපන්, මියගිය, මෝඩ යන මොවුන්ගෙන් මුලින් කී දෙදෙනා උතුම් ය. අන්තිමයා උතුම් නොවේ. මුලින් කී දෙදෙනා වරක් දුක් ඇති කරති. අන්තිමයා වනාහි පියවරක් පියවරක් පාසා දුක් ඇති කරති.

මළ මිනිසා තුළ සජීවී බවක් නොමැත. ඔහු හරියට දර කඩක් බඳු ය. අතපය, කන්, නාසාදී, ඉන්ද්‍රියෝ ද ක්‍රියාත්මක නොවෙති. ඔහුට කළ හැකි දෙයක් නොමැත. මිනිසත්කමක් ලැබුව ද බොහෝ දෙනෙක් එහි වටිනාකම නොදනිති. එයින් නිසි ප්‍රයෝජන නොගනිති. පින්දහම්වල නොයෙදෙති. යුතුකම් ඉටු නොකරති. ධර්ම ඥනයක් ලැබීමට උත්සාහවත් නොවේ. එවැනි හිස් මිනිසුන් ජීවත්වුව ද මළවුන් හා සමාන ය. ඔවුන්ගෙන් අන්‍යයාට යහපතක් නොවෙති. මෙලොවට යහපතක් කර නොගන්නා ඔවුන් පරලොව දී සතර අපා දුක්වලට පැමිණේ.

මේ බව තේරුම් ගැනීම ඉතා වැදගත් වන්නේ ය. මේ යුගය තුළ ඉපදෙන සත්වයින් පින්වන්තයෝ ය. නමුදු ජීවිතවල වටිනාකම නොදත් බොහෝ දෙනෙක් සත්ව සමූහයාටත්. ස්වභාව ධර්මයාටත් අහිත පිණිස, අවැඩ පිණිස කටයුතු කරති. ධර්මානුකූල ව සිතීමේ දී කොතරම් බාධක සමූහයක් ඔස්සේ ද අපි මිනිසත් බවක් ලබා ඇත්තෙමු. ලෝවැඩ සඟරාවෙහි ඒ බව මනාව පැහැදිලි කොට ඇත.

“නොයෙක් සියලු සසර දුක් දුරුකර, නිසැකව ම නිවන් සිරි සැපත ළඟා කරන්නා වූ පින්, සියල් සතුනි කරන්න”.

එහෙත් පින්කම් කළ නොහැකි නොකල් අටකි. එනම් තිරිසන් බවය, ප්‍රේත විෂයය, දීර්ඝායුෂ ඇති දිව්‍ය නිකාය, පසල් දනව්වක ඉපදීම, දුස්ප්‍රාඥයකු වීම, මිත්‍යාදෘෂ්ටික වීම, අබුද්ධෝත්පාද කාලයක් වීම යන අට අෂ්ට දුෂ්ටක්ෂණ නොහොත් පින් කිරීමට නොහැකි අවස්ථා හා කාල වශයෙන් පැහැදිලි වේ.

එම අටට හසු නොවී මිනිසත් බවක් ලබා තිබීම දුර්ලභ කරුණක් සේ ම අප ලද වාසනා මහිමයකි. නමුදු බොහෝ දෙනෙක් එම දුර්ලභ අවස්ථාවෙන් ප්‍රායෝජන නොගනිති. ජීවත් වනවාට ජීවත්වීම, කම් සැපයට ම ගිජු වීම, අකාලයේ ජීවිතය විනාශ කර ගැනීම, පින් දහම් නොකිරීම යුතුකම් ඉටු නොකිරීම, මිනිසත්කමේ වටිනාකම තේරුම් නොගැනීම බොහෝ සත්වයෝ සිදු කරති. ඒ අනුව ඔවුන් ප්‍රමාදවූවන් ලෙස බුදුදහමේ පෙන්වා දී ඇත.

ජීවිතයක සැබෑ තත්ත්වය තේරුම් ගෙන ජීවත්වීම ප්‍රඥවන්තයින්ගේ ලක්ෂණය යි. දුෂ්ප්‍රාඥයින් නිතරම සිය නුවණින් කටයුතු නොකොට මැරි මැරී සසර උපදිති. ඔවුන් සසර ජය ගැනීමට අපොහොසත් වෙති. එබැවින් සියල්ලෝ ම සිතට ගෙන අද අදම පින් කර ගත යුතු ය.

**අද අද එයි මරු පින් කර ගන්නේ**
**කෙලෙස ද සෙට මරු නේති සිතන්නේ**
**කිකලද මහසෙන් මරු ඇප වන්නේ**
**කුමට ද කුසලට කම්මැළි වන්නේ**

මරු එන බැවින් අද අදම පින් කර ගන්න. සෙට මරණය නොවන්නේ යැයි සිතන්නේ කෙසේද? මහා සේනාවක් ඇත්තා වූ මාරයාට ඇප වන්නේ කවර කාලයෙහි ද? එබැවින් කුසලට කම්මැලි වන්නේ කුමකට ද?

ඒ අනුව අප නිරන්තරයෙන් සිතිය යුත්තේ මාරයා අප සමඟ නිතර වසන බව ය. මොන තරම් මිනිස් බලය, ධන බලය, අවි ආයුධ බලය තිබුණ ද ඒ කිසිවක් මාරයාට අදාළ නැත. තාප්ප පිට තාප්ප බැඳ සිටිය ද සෑම දෙනෙක් ම මාරයාට වසඟ ව ඇත. අප ළඟ සිටින්නේ දූදරුවන්, මව්පියන්, ස්වාමි භාර්යාවන්, ඥාතිමිත්‍රාදීන් නොව සත්‍ය වශයෙන් ම අප ළඟින්ම සිටින්නේ මාරයා පමණි. අප මාරයා විසින් රැගෙන යන කල්හි කවුරු සිටිය ද වළක්වා ගැනීමට නොහැකි ය.

කෙටි කාලයක් තුළ ජීවත් වුව ද මළවුන් ලෙස ජීවත් නොවී සැබෑ මිනිසකු ලෙස ජීවත්වීම ඉතා වැදගත් වේ. මිනිසත්කමේ වටිනාකම හඳුනා ගත යුතු ය. කරුණාව, දයාව, මෛත්‍රිය වැනි මානුෂික ගුණාංග වර්ධනය කළ යුතු ය. නැති බැරි අයට උදව් උපකාර කිරීම, වැඩිහිටියන්ට ගරු සත්කාර දැක්වීම වගේම සැලකීම, කෘතගුණ සැලකීම, මව්පියන් පෝෂණය කිරීම, රටට දැයට සේවයක් කිරීම, යහපත් චරිත වර්ධනයක් ඇති කර ගැනීම ආදි දේ සිදු කළ යුතු ය. ලද සෑම මොහොතකම පින් කළ යුතු ය.

සොබාදහමට ආදරය කිරීම, සතා සිව්පාවුන්ට ආදරය කිරීම අද මිනිසුන් අතින් දුරස් වී ඇත. මිනිසා “සක්කාය දිට්ඨිය” නොහොත් ආත්ම සංකල්පය මත ම ඉඳිමින් තම තමන් ගැන ම සිතීමත්, තමන්ගේ අය ගැන පමණක් සිතීමත් අයුක්ති සහගත ක්‍රියාවකි. ඒ තරමට ම අද මිනිසත්කම පිරිහී ගොස් ඇත. බුදුරදුන් ආදර්ශයෙන් ම පෙන්වා වදාළ පරාර්ථකාමිත්වය වර්ධනය කිරීම අද අද ම කළ යුතුව ඇත. මුළු විශ්වය ම හසුවන අයුරින් මෛත්‍රිය ප්‍රගුණ කරමින් එය විශ්වයට ම පැතිරවීමට හොඳ මානසිකත්වයක් ඇති කර ගත යුතු ය. එවිට සුවඳ හමන මල් සේ මිනිසත්කමේ සැබෑ තත්වය ඉස්මතු වනු ඇත. එවැනි අය මිය ගිය ද ජීවත් වන්නවුන් ලෙස අන් හදවත් තුළ සදා අමරණීය වනු ඇත.



මහව උඩගම ශ්‍රී ඉන්දසුමන
මහ පිරිවෙන්හි
ප්‍රවීණාචාර්ය , ප්‍රවචන කීර්ති
ශ්‍රී ලේඛන ශාස්ත්‍රී
**ගලගෙදර**
**රතනවංස ස්ථවිර**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## පොසොන් අව අටවක 2022-06-21

# නොසැලීම


ජීවිතයේ අනේකවිධ දුක්ඛ දෝමනස්සයන්ට සේ ම සතුටුදායක අවස්ථාවන්ට ද මුහුණ දෙන්නට සිදුවීම ලෝක ධර්මතාවයි. මෙසේ ලාභ – අලාභ , අයස – යස, නින්දා –ප්‍රශංසා, සැප – දුක ලෙස ලෝක ධර්මතාවන් අටකට මුහුණ දෙන්නට සිදුවීම සියල්ලන්ට ම සමාන වුව ද ඒ සඳහා ඒ ඒ පුද්ගලයා මුහුණ දෙන ආකාරය එකිනෙකාට වෙනස් ය. කෙනෙක් මානසික සුවයෙන් ජීවිතයට මුහුණ දෙන්නේ ද ?, තවත් කෙනෙක් අධික පීඩනයෙන් යුතුව දුක්බර ජීවිතයක් ගෙවන්නේ ද මේ ලෝක ධර්මතාවන්ට මුහුණ දෙන ස්වභාවයේ ඇති වෙනස්කම් නිසා ය.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ අටලෝ දහමෙහි කම්පා නොවන ලෙසට ය. ලාභය සෑම කල්හි ම නොලැබේ. අලාභය ද හැම කල්හිම නොවේ. අද ලාභ ලැබී හෙට අලාභ විඳින්නට සිදු විය හැකි ය. මේ ආකාරයට චක්‍රයක් සේ වරින්වර මුහුණ දෙන්නට සිදුවන අප අකැමැති ලෝක ධර්මතාවන් හමුවේ හඬා වැටෙනවා නම්, මානසිකව කඩා වැටෙනවා නම් ඒ පීඩාකාරී බව මෙලොව පමණක් නොව පරලොව ද දුක්ඛිත තත්ත්වයකට ඇද දමයි. එහෙයින් කඩාවැටීම් හමුවේ සිත ශක්තිමත් කර ගත යුත්තේ එහි අනිත්‍ය බව හා ලෝක ස්වභාවය එය බව මැනවින් තේරුම් ගනිමිනි.

එමෙන් ම ලාභය, යසස, ප්‍රශංසාව , සැපය හමුවේ බොහෝ දෙනෙක් අධික ප්‍රීතියට පැමිණෙති. මාන්නය, උඩඟු බව, ආඩම්බරකම ඇති කර ගනිති. එවැනි සිතිවිලිවලින් සිත පුරවා ගත් පුද්ගලයාට අලාභය, අයස, නින්දාව, දුක හමුවේ ශක්තිමත් ව මුහුණ දීමට නොහැකි ය. කඩාවැටීම එතැන ය. මනසින් දුර්මුඛ වූ වහා ම ජීවිතයේ සියලු කටයුතු අඩපණ වන්නේ ය. එහෙයින් ලැබීම් මෙන් ම නොලැබීම් හමුවේ අනවශ්‍ය ලෙස උද්ධාමයට පත්නොවී, අනවශ්‍ය ලෙස දුක් නොවී, සතුට සේ ම දුක ද සාමාන්‍ය ලෙස විඳ දරා ගන්නට හුරුවිය යුතු ව ඇත.

විවිධ සමාජ ආර්ථික තත්ත්වයන් නිසා අද මුළු මහත් ලෝකයට ම විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙන්නට සිදුව ඇත. ලාංකිකයන් ලෙස අපට ද ඒ ලෝ දහම පොදු ය. එකිනෙකාට චෝදනා කරමින් හෝ, සිදුවූ විපත් ගැන, සිදුවන්නට යන විපත් ගැන එකිනෙකා සමඟ කියවමින් කාලය අපතේ හරිනවා වෙනුවට යම් දුෂ්කරතාවක් වේ නම් ඊට මුහුණ දෙන ආකාරය ගැන, එයින් මිදෙන ආකාරය ගැන, ඒ සඳහා පුරවැසියෙක් ලෙස තමන්ගෙන් ලැබිය යුතු දායකත්වය, යුතුකම, වගකීම කෙබඳු ද යන්න සිතා බලා හැකි උපරිමයෙන් දුෂ්කරතා මඟ හැර ගන්නට දායක විය යුතු ව ඇත.

අනලස්බව, උට්ඨාන වීර්යය, උනන්දුව, ඕනෑකම ඇති පුද්ගලයාට සොබා දහමේ ආශිර්වාදය ද හිමි වේ. එහෙයින් දුෂ්කරතා හමුවේ නොසැලී, ඊට ශක්තිමත් ව මුහුණ දෙමින් සමාජයේ අන් අයට ද උපකාරී වෙමින් ජීවිතය ජය ගන්නට උත්සාහ කළ යුතු ය. සරල, සැහැල්ලු, ඇවතුම් පැවතුම්වලට, අල්පේච්ඡ දිවියකට හුරුවිය යුතු ය. බෞද්ධයාගේ ස්වභාවය එයයි.



# ජීවිතයට වටිනාකමක් දෙන්නේ මෙලෙසයි



කොළඹ ආනන්ද විද්‍යාලයේ
විශ්‍රාමික සහකාර විදුහල්පති
සද්ධර්ම කීර්ති ශ්‍රී
ත්‍රිපිටකාචාර්ය
**දිවියාගහ යසස්සි නා හිමි**

*අප්පසුතායං පුරිසො – බලිවද්දෙව ජීරති*
*මංසානි තස්ස වඩ්ඪන්ති – පඤ්ඤා තස්ස න වඩ්ඪති*

**බොහෝ අය විවිධ දේ කථා කිරීමට දක්ෂ වෙති. එහෙත් තැනට සුදුසු ලෙස හරයක් ඇතුව කතා කරන්නේ කීයෙන් කී දෙනෙක් දැයි සිතා බැලීම වැදගත් ය.**

වැඩකට නැති කතා පවත්වන වාචාලයා ප්‍රකට කරන්නේ තමන්ගේ ම නූගත්කමයි. එයින් ඔහු පිරිහීමට ද පත් වෙයි. බුදුරජාණන් වහන්සේ වැඩ විසූ කාලයේ ජීවත් වූවා ලාලුදායි නම් හිමිනමක්. මඟුල් ගෙදරට වැඩිය හොත් අවමඟුලක් වූ තැනකට සුදුසු ධර්මයක් දේශනා කරති. අවමඟුල් ගෙදරකට ගිය හොත් එහි දී දේශනා කරනුයේ මඟුල් ගෙදරකට සුදුසු ධර්මයකි.

අවස්ථාවෝචිත පරිදි යමක් ප්‍රකාශ කළ යුතු යැ යි උන්වහන්සේට වැටහීමක් නැත. මේ සිදුවීම නිමිති කොට බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ගාථාවක් ඉහත දැක්වේ. තමන්ටත්, අනුන්ටත් හිත වැඩ සලසන්නා වූ, ධර්ම ශාස්ත්‍රාදිය නූගත් මනුෂ්‍යයා ඇට, මස්, නහර ආදියෙන් වර්ධනය වන්නා වූ ගොනකු සේ වැඩේ. එහෙත් ප්‍රඥාව නො වැඩේ. බුදුරජාණන් වහන්සේ එකී ගාථාවෙන් පෙන්වා දුන්නේ ඒ ධර්මතාවයි.

උපන් දවසේ සිට මනුෂ්‍යයාගේ පමණක් නොව සෑම සත්වයකුගේ ම ශරීර අනුක්‍රමයෙන් ලොකු මහත් වී වැඩෙයි. ඒ අන්දමට මීටර් ගණනින් හෝ කිලෝ ගණනින් කොපමණ දිග හෝ බර වැඩි වූ තරමින් කිසිවකු ශ්‍රේෂ්ඨත්වයට පත්වන්නේ නැත. මනුෂ්‍යයා ඇතුළු සෑම සත්වයන් ම උසස් තත්ත්වයට පත්වනුයේ ප්‍රඥාවෙන් වැඩි දියුණුව කටයුතු කිරීම නිසා ය.

ප්‍රඥාව යනු කුමක්ද? සමාජයේ බොහෝ දෙනා සිතනුයේ විද්‍යාව ඇතුළු විවිධ විෂයයන් පිළිබඳ උසස් දැනුමෙන් යුක්ත වුවහොත් ප්‍රඥාවන්තයකු වන බවයි. එහෙත් එය සම්පූර්ණ සත්‍යයක් නොවේ. සෑම දෙයක් පිළිබඳ ගැඹුරින් නිවැරැදි අවබෝධයක් ලබා ගනී නම්, එය ප්‍රඥාවේ ලක්ෂණයයි. පජානනං පඤ්ඤා යනුවෙන් දැක්වෙන විග්‍රහයට අනුව යමක් පිළිබඳ ඉතිරි නොකොට සියල්ල මනාව දැන ගැනීම ප්‍රඥාවේ හොඳම ලක්ෂණය යි.

ධර්ම ග්‍රන්ථයන්හි ප්‍රඥාව අංශ ගණනකට බෙදා දැක්වෙයි. දහම් අසන අවස්ථාවෙහි කෙනකුට ඇතිවන නුවණ සුතමය පඤ්ඤා නමින් දැක්වෙයි. වැරැදි වැඩ කිරීම නුසුදුසුයැ යි සලකා කය – වචන දෙක හික්මවා ගෙන නුවණින් කටයුතු කිරීම සීලමය පඤ්ඤාව වශයෙන් දැක්වෙයි. එක් අරමුණක සිත පිහිටුවාගෙන වැඩි දියුණු කිරීම ඇතුළත් වන්නේ භාවනාමය ප්‍රඥා ගණයට ය. මේ අන්දමට ලෞකික ජීවිතයක් ගත කරන කෙනකු තමන්ගේ ප්‍රඥාව වර්ධනය කර ගැනීමෙන් යහපත් ජීවිතයක් ගත කිරීමට පමණක් නොව ලෝකෝත්තර තත්ත්වයන් ද ලබා ගැනීමේ වාසනාව උදා කර ගනියි.

ජීවත් වන ඕනෑම කෙනකුට තමන්ගේ අරමුණු සාර්ථක කර ගැනීම සඳහාත්, ගැටලු නිරාකරණය කර ගැනීම සඳහාත් උපකාර වනුයේ ප්‍රඥාවයි. උපන් සෑම කෙනකුගේ ම ශරීරය විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වෙමින් ද ඇස්, කන් ආදී ඉන්ද්‍රියයන් හා දෙඅත්, දෙපා ආදි අවයවයන් ද දුබල වන විට නො සැලෙන හෙවත් කම්පා නොවන මනසක් ඇතිවනුයේ ප්‍රඥා බලය නිසා ය. කෙනකු තුළ ඇති ලෝභාදී කෙලෙස් මතුවන්නට නොදී අනුක්‍රමයෙන් විනාශ කරයි ද, ඒ සඳහා යෙදෙන නුවණ පඤ්ඤාසත්ත නමින් ධර්ම ග්‍රන්ථයන්හි දැක්වේ. කෙලෙස් යටට ඔබා දා නැඟීසිටීමේ නුවණ පඤ්ඤාපාසාද ලෙස හැඳින්වේ. සත්වයා පිළිබඳ හරි දැකීමක් ලැබෙනුයේ පඤ්ඤා ආලෝකයෙනි. යම්කිසි කෙනකු තුළ හරි වැටහීමක් ඇතිකර ගැනීමට ශක්තියක් වේ ද එය පඤ්ඤාරතන වශයෙන් දැක්වෙයි.

කවර අන්දමකට ජීවත්වන පුද්ගලයාගේ ජීවිතය වඩා වටී දැයි දිනක් ආලවක යක්ෂයා බුදුරජාණන් වහන්සේගෙන් විමසී ය. ප්‍රඥාවෙන් යුක්ත ව ජීවත්වීම ශ්‍රේෂ්ඨ යැ යි උන්වහන්සේ පෙන්වා දුන්හ.

මිල මුදල්, ගේ දොර, කණකර ආභරණ ආදියෙන් වටිනාකම් ඇතිකර ගැනීමට දැඩි උත්සාහයක් ගන්නා වර්තමාන සමාජයට බුදුරජාණන් වහන්සේ වදාළ ප්‍රඥාවන්තයකු වීමේ අගය සිහියට ගෙන කටයුතු කිරීමට දැන් කාලය උදා වී ඇත.



# කස්සක ලෙනෙහි වැඩ විසූ

# අරියමිත්ත තෙරුන් වහන්සේගේ කතාව

**පුරාණ ලංකාද්වීපයේ වැඩ සිටියා අරියමිත්ත කියලා මහතෙර නමක්. කස්සක නම් පර්වතයේ එනමින් ම හැඳින් වූ ලෙනක තමයි වැඩ සිටියේ. පිණ්ඩපාතයට වැඩම කළේ අසල තිබුණු ගමට. ශ්‍රද්ධාවෙන් පිරුණු එක් මවක් සහ දියණියක් ඒ ගමේ සිටියා. පියාගේ වියෝව නිසා පවුලේ ජීවන බර ගෙන යන්න සිදු වුණේ මවට. දියණියට කුලී වැඩක් කිරීමට තරම් වයසක් පිරී තිබුණේ නෑ. බොහෝ ම අමාරුවෙන් ජීවත් වුණත් දන්දීම නම් අතහැරියේ ම නෑ.**

තමන්ටත්, දියණියටත් ආහාර නැති වුණත් පිණ්ඩපාතයේ වැඩම කරන තෙරුන් වහන්සේට දන් දෙන්න වේලාව ගණිමින් බලා සිටියා.

තෙරුන් වහන්සේ දිනපතා පිණ්ඩපාතයේ වැඩියේ මේ නිවසට. තෙරුන් වහන්සේ පිණ්ඩපාතය අරගෙන නැවතත් පර්වත ලෙනට වැඩම කිරීම තමයි සිරිත. දවසක් තෙරුන් වහන්සේ වේලාසනින් වැඩම කර නිවස ඉදිරිපිට වැඩ සිටියා.

උපාසිකාව දවසේ කුලී වැඩට යාමට සූදානම් වෙමින් උදේ ආහාරයට කැඳ පිළියෙල කරමිනුයි සිටියේ. තෙරුන් වහන්සේ දැක නිවසට වැඩමවා උන්වහන්සේට ආසන පනවා දී කැඳ ආහාරය පිළිගැන්වූවා. නැවතත් මුළුතැන් ගෙට ගියා. දියණිය අමතා ..පුතේ දවල් කෑමට පලා කොළ දමා හැදූ මේ හුණු සහලේ ඇඹුල් කැඳ මම අරගෙන යන්නම්.

මාපුත් අරියමිත්ත තෙරුන් වහන්සේට දවල් දානය පිළියෙළ කරලා දෙන්න ඕන. මං මැස්ස උඩ තියල තියනවා කැඩුණු වළඳක්. එහි පරණ හාල් ටිකක් ඇති. කිරිත්, හදිස්සියකට ගන්න තියපු ගිතෙලුත්, පැණිත් එතැන ම තියෙනවා. ඒවා අරගෙන බතක් උයලා පිළිගන්වන්න. ඉතිරිවුණොත් ඔයත් ඒවගෙන් ම දවල් වේල පිරිමහගන්න. මම එනකොට අද ගොඩක් රෑවෙයි. අද ටිකක් ඈත වැඩක් තමයි ලැබී තියෙන්නේ,යි පවසා සියලු කටයුතු සැලසුම් කර කැඳ ටිකක් බී තෙරුන් වහන්සේ වැඳ නික්ම යන්න සූදානම් වුණා.

තෙරුන් වහන්සේට මවගේත්, දියණියගේත් කතාබහ කන වැකුණා. ..මහ උපාසිකාව රාත්‍රියේ ඉතිරිවුණු බත් ටිකක් ආහාරයට ගෙන, දවල් කෑමට ඇඹුල් කැඳ ටිකක් අරගෙන යන්නයි මේ සූදානම. බොහෝම අමාරුවෙන් ජීවත් වන බව අදයි හොඳින්ම දැනගත්තේ. මෙතෙක් දවසක් කිසිදු අඩුවක් නැතිව වගෙයි දන් දුන්නේ.

දුක සේ ජීවත් වන මේ දෙන්නා මට දන් දීලා කිසිම දෙයක් බලාපොරොත්තු වෙන්නේ නෑ. මම මහෝපාසිකාවගේ පුතෙක් නෙවෙයි. සහෝදරයෙක් හෝ ඥාතියෙක්වත් නෙවෙයි. අසවල්වැසියෙක් හෝ යහළුවෙක්වත් නෙවෙයි. කුඹුරු, වතු පිටි වගා කර ගැනීමට හෝ ගෙවල් දොරවල් පිරිසුදු කර ගැනීමට හෝ අන් කටයුත්තක් සිදු කර ගැනීමට හෝ කිසිදු අපේක්ෂාවක් නෑ.

දිව්‍ය, මනුෂ්‍ය, නිවන්, ත්‍රිවිධ සම්පත් අපේක්ෂාවෙන් ම යි මට මේ දන් දෙන්නේ. මම තවමත් පෘථග්ජනයි. රාග, ද්වේෂ ආදී කෙලෙස් තවමත් තියනවා. කිසිදු මාර්ගඵලයක් ලබා ගෙන නෑ.

අවුරුදු ගණන් උත්සාහ කළත් බැරිවුණා. දුක සේ මේ දෙදෙනා මට දන් දුන්නා. මාර්ගඵල නැතිව තවත් නම් මේ පිරිසගෙන් දන් පිළිගන්නට බෑ ,යි කල්පනා කළා.

පසුම්බියෙන් ඉවතට ගෙන මේසය උඩ තබා තිබුණු පාත්‍රය නැවතත් වහා ම පසුම්බියට දාගත්තා. ..වසර ගණනක් දුක සේ දන් දෙන, අධික ශ්‍රද්ධා සම්පන්න මව්තුමියටත්, දියණියටත් ත්‍රිවිධ සම්පත් ලබා දී මිස නැවතත් මේ නිවසට පිණ්ඩපාතයේ නම් එන්නේ නෑ,යි අධිෂ්ඨාන කරගෙන සිවුර සකසාගෙන කස්සක ලෙනට ම වැඩම කළා. බොහෝ වේලාවක් පයින් ම ගමන් කළා.

කුටියට වැඩම කරන විට ශරීරය දහදියෙන් තෙත් වී තිබුණා. ඒ සිවුර වැලෙහි එල්ලා ශරීරය පිරිසුදු කරගෙන, පාත්‍රය ඇඳ යටින් තබා, භාවනා ආසනයට පැන නැඟී ..මම රහත් වී මිස යළිත් මේ ආසනයෙන් නැඟිටින්නේ නෑ. ඇඳ යට තැබූ පාත්‍රය රහත් වී මිස ගන්නේ නෑ. නිරාහාර ව මිය ගියත් රහත්ඵලය නො ලබා නැඟිටින්නේ නෑ, යි නැවතත් සිත දැඩි කර ගෙන භාවනාවට එළැඹුණා.

බලවත් ස්නේහයක්, කරුණාවක්, අනුකම්පාවක් මහෝපාසිකාව සහ ඇයගේ දියණිය කෙරෙහි ඉපදී තිබුණා. එයම භාවනා කමටහන් ලෙස ගත් තෙරුන් වහන්සේ භාවනාව ආරම්භ කළා.

පැවිද්ද ලබා බොහෝ කලක් භාවනා කරමින් විධිමත් පුහුණුවක් ලබා තිබුණු නිසා පෙරබත් කිසෙහි ම ඒ කියන්නේ උදේ වරුවෙහි දී ම තෙරුන් වහන්සේට උතුම් වූ නිර්වාණ සම්පත්තිය ලබා ගන්න භාග්‍ය උදා වුණා.

තෙරුන් වහන්සේගේ භාවනා කටයුතුත්, ආරක්ෂාවත් තහවුරු කරමින් ලෙන සමීපයේ වැඩ සිටි වෘක්ෂ දේවතාවා අර්හත්ඵලයට පත් තෙරුන් වහන්සේ දැක ..ශ්‍රේෂ්ඨ පුරුෂයාණෙනි, උතුම් පුරුෂයාණෙනි, ඔබ වහන්සේට නමස්කාර වේවා. කෙලෙස් ප්‍රහීණ කළ ඔබ වහන්සේ දැන් දන් පිළිගැනීමට සුදුස්සෙක්. ස්වාමිනි පිඬු පිණිස හැසිරෙන ඔබ වහන්සේ වැනි රහත් උතුමන් වහන්සේට දන් දී මහලු මවත්, දියණියත් දුකින් මිදෙනු ඒකාන්තයි.

ස්වාමීනි, ඔවුන්ට අනුකම්පා කළ මැනව,යි ප්‍රීතියෙන් සාධු කාර දෙමින් ආරාධනා කළා. තෙරුන් වහන්සේත් එය අසා තවමත් පෙරවරු සමය දැයි ලෙනෙන් පිටතට පැමිණ හිරු එළියත්, හිරු බැස යන ආකාරයත් බලා තවමත් පෙරවරු සමයැයි නිශ්චය කර ශ්‍රද්ධාවත් මහෝපාසිකාවටත්, දියණියටත් අනුග්‍රහ පිණිස ඒ නිවසට ම වැඩම කළා.

දියණිය මවගෙන් ලැබුණු උපදෙස් අනුව ගිතෙල් සහ පැණි යොදා සැකසූ කිරිබත් හැලිය තබාගෙන තෙරුන්වහන්සේ වඩින තෙක් පෙර මඟ බලමින් දොරකඩට ම වී බලා සිටියා. උදෑසන කාලය අවසන් වේගෙන යමින් තිබුණා.

ඇය බොහෝ සිත්තැවුල් ඇති කර ගත්තා. තෙරුන් වහන්සේ නැවතත් නො වඩින්නේදැයි සිතමින්. එහෙත් අරියමිත්ත තෙරුන් වහන්සේ දුටු විගසම බොහෝ සතුටට පත් වුණා. උන්වහන්සේගේ දෙපා නමැද පාත්‍රය අතට ගෙන එය කිරිබත්වලින් පුරවා පිළිගන්වා නැවතත් නමස්කාර කළා, උන්වහන්සේත් .. නැඟණිය, ඔබත්, ඔබගේ මවත් දෙදෙනා ම සුවපත් වේවා, නිදුකින් වෙසේවා,යි ආශිර්වාද කර වැඩම කළා.

උදේ වැඩම කළ අවස්ථාවේ දුටු රූපයට වඩා අරියමිත්ත තෙරුන් වහන්සේගේ රූප ශෝභාව බබළමින් තිබුණා. පිරිසුදු ඡවි වර්ණයත්, ප්‍රසන්න ඉන්ද්‍රියනුත් දුටුවා. ඇයට මහත් සතුටක් දැනුණා. මව ගෙදර එන තෙක් නො ඉවසිල්ලෙන් සිටි ඇය පෙරමඟ බලමින් සිට මව පැමිණි විගස ම මිදුලට දුවගෙන ගොස් .

මෑණියනි, ඔබගේ පුත් අරියමිත්ත තෙරුන් වහන්සේගේ රූප ශෝභාව වෙනදාටත් වඩා වැඩියෙන් බබළමින් තිබුණා.

වෙනදාටත් වඩා උන්වහන්සේගේ ඉඳුරන් හරිම සංවරයි. ප්‍රසන්නයි. බලන්න ආශා උපදවනවා,යි උන්වහන්සේගේ විශේෂතා සියල්ල ම කියා සිටියා. අරියමිත්ත තෙරුන් වහන්සේ අර්හත්ඵලයට පැමිණි බව මව එයින් ම අවබෝධ කර ගත්තා. ..මා පුතු සම්බුද්ධ ශාසනයේ කටයුතු මුදුන් පමුණුවා ගත්තා,යි දියණිය අමතා සතුට ප්‍රකාශ කළා යි යන රසවත් කතා පුවතක් මජ්ඣිම නිකාය අටුවාවේත්, සතිපට්ඨාන විභංගයෙත් සඳහන් වෙනවා.

කොපමණ දුප්පත් වුවත්, දන් දිය යුතු බවත්, දන් පිළිගැනීමේ දී භික්ෂුව




දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

දායකයාගේ දෙලොව යහපත පිණිස සහ සම්බුදු සසුනේ පරම ශාන්තිය ලබා ගැනීම වෙනුවෙන් කටයුතු කළ යුතු ය යන්නත් මේ කතා පුවතින් පෙන්වා දෙනවා.

දායකයාත්, භික්ෂුවත් තමන්ගේ කටයුතු සිදු කරන්නේ නම්, ඔවුන් බුදුරජාණන් වහන්සේගේ මාර්ගයේ ගමන් කරන්නෝ වෙනවා. එයින් දෙපිරිසට ම අපමණ ප්‍රීතියක් ලබා ගැනීමටත්, ගුණදහමින් පොහොසත් සමාජයක් තවත්වා ගැනීමටත් හැකි වෙනවා.

# සට්ඨිකූට සහස්ස ප්‍රේත වස්තුව



දෙමැද, දැරණියගල ශ්‍රී චිත්ත විවේකාරාමයේ
**ඇටම්පොල ඤාණිස්සර හිමි**

**භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා ප්‍රේතයකු අරභයා මේ ප්‍රේත වස්තුව දේශනා කළ සේක.**

යට ගිය දවස බරණැස් නුවර විදීම් ශිල්පයෙහි අති දක්ෂ, පිළෙක් විසීය. පිළෙක් යනුවෙන් අදහස් කරන්නේ දුවන්න පනින්න බැරි කකුල් දෙකම අහිමි වූ පුද්ගලයෙකි. නුග ගසක් මුලට වී නුග පත්වලට විද විවිධ චිත්‍ර අඳිනු ලැබේ. ගල්කැට විද සිදුරු කිරීමෙන් මෙම චිත්‍ර ඇඳීම සිදුවන බව දත යුතුයි. ඉලක්කයට විදිය හැකි අයකුට පමණක් කළ හැකි කාර්යයෙකි.

එක දවසක් බරණැස් රජතුමා මේ නුග ගස යටින් ගමන් කරන කල්හි නුග පත්වල විචිත්‍ර රූ සටහන් දැක මෙසේ කරන ලද්දේ කවරෙක් විසින් දැයි රැස්ව සිටි පිරිසගෙන් විමසි ය. එවිට එසේ කරන ලද්දේ මේ පිළා විසිනැයි පැවසී ය.

රජතුමා ඔහු කැඳවා යහළුව, රාජ සභාවේ පුරෝහිත බ්‍රාහ්මණයා කටමැත දොඩවන පුද්ගලයෙකි. මේ කට වාචාල පුද්ගලයාගේ කතා කිරීම නැවැත්විය යුතුයි. ඔහු නොදැනුවත්ව ම ඔහුගේ කුසට එළු බෙටි නැළියක් පිරවිය යුතු ය. ඔබට එය කළ හැකි දැයි ඇසීය. පිළා ඒ කටයුත්ත කිරීමට බාර ගත්තේ ය. රාජ මාළිගාවට පැමිණෙන ලෙස ඔහුට අණ කොට රජතුමා පිටත්ව ගියේය. රාජ සභාවට ගිය පිළා තිරයක් පිටුපස සිට තිරයේ සිදුරකින් එළුබෙටි නැළියක් පුරෝහිතගේ කටට විදින ලදී. ඒ එළු බෙටි නැළියම ගිල දැම්මට පුරෝහිත බ්‍රාහ්මණයාට සිදු විය.

අනතුරුව රජතුමා බොහෝ කොට කතා කරන පුරෝහිත කැඳවා පුරෝහිතය, ඔබ නිතර නිතර, කතාවේ යෙදෙන බැවින් දැන් තොගේ කුස එළු බෙටිවලින් පිරී ඇත. නිවසට ගොස් එළු බෙටි වමාරාලවයි කීය.

පිළා රජතුමාගෙන් බොහෝ සම්පත් ලැබීය. සම්පත් ලැබූ ඔහු දැහැමිව සතුටුව ජීවත් විය. ඒ අතර එක්තරා පුරුෂයෙක් විදීමේ අති දක්ෂ මේ පිළා වෙත පැමිණ ඔහු දත් විදීමේ ශිල්පය ඉගෙන ගත්තේ ය. ඉගෙනගත් ඔහු තමා උගත් ශිල්පය පිරික්සීමට ඉතාමත්ම වැරැදි පාප ක්‍රියාවක් සිදු කළේ ය.

ඒ පාපි ක්‍රියාව වූයේ ගංතෙරක විසූ සිල්වත් ගුණවත් සුනෙත්ත නම් පසේ බුදුරජාණන් වහන්සේගේ කනට ගලක් විදීමයි. ඒ ගල් පහරින් පසේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේක. මේ සිදුවීම දැනගත් මිනිස්සු ගල් මුගුරුවලින් ගසා ඔහු මරණයට පත් කළහ. ඔහු මරණයෙන් පසු අප්‍රමාණ දුක් සහිත මහා නරකයෙහි උපන්නේ ය.

අපා දුක් විඳ එයින් චුතව නැවත ප්‍රේත ලෝකයෙහි ඉපදුණේ ය. ප්‍රේත ලෝකයේ උපන් ඔහු අප්‍රමාණ දුක් වින්දේය. කුළු හැට දහසක් ඔහුගේ හිස මුදුනට වැටේ. උදේ දවල් රාත්‍රී යන තුන් කාලයෙහි ම මේ ලෙස ගල් පර්වත හැට දහසක් හිස මත වැටීමෙන් හිස පොඩිවී දුක් විඳින ප්‍රේතයා මහා මුගලන් මහ රහතන් වහන්සේට මුණ ගැසිණ.

මුගලන් මහ රහතන් වහන්සේ ප්‍රේතයාගෙන් මෙසේ දුක් විඳීමට තමා පෙර භවයේ කිනම් වූ අකුසල කර්මයක් කළෙහි දැයි විමසුහ. පසේ බුදුරජාණන් වහන්සේ නමකට තමා සිදු කළ සාපරාධී ක්‍රියාව නිසා අපා දුක් විඳ මෙසේ ප්‍රේත ලෝකයේ ඉපිද දුක් විඳීමට සිදු වූ බව ප්‍රේතයා විසින් ප්‍රකාශ කරන ලදී.

තොප කළ අකුසල කර්ම ඉතාමත් බරපතළ ය. එහි විපාක තා විසින්ම විඳිය යුතු ය. ලොව්තුරා බුදුවරයකුට වත් මෙබඳු අකුසල කර්මයක විපාකය වෙනස් කළ නොහැකි බව වදාළහ.

මුගලන් මහ රහතන් වහන්සේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මේ පුවත දන්වා සිටියහ. බුදුරජාණන් වහන්සේ පසේ බුදුරජාණන් වහන්සේලාගේ මහත්වූ ගුණය වර්ණනා කරමින් රැස්ව සිටි පිරිසට දහම් දෙසූ සේක.

# සසර බියකරුයි පාපයෙන් වළකින්න

**රජගහනුවර වේළුවන විහාරය අසල චුන්දසූකරික නම් උරු වැද්දෙක් විසීය. ජීවිතය ම පාපාකාරීව ගෙවූ ඔහුගේ ජීවනෝපාය වූයේ ඌරු මස් වෙළෙඳාම ය. ඌරන් ඇති කොට විකුණා ලැබෙන මුදලින් ගේ දොර කටයුතු කරගත් ඔහු ඉතිරි මස් ආහාරයට ගත්තේ ය. ඌරු කොටු සාදා තිබුණේ ද ඔහුගේ නිවසේ ම ය. ඌරන් මරා මස් විකිණීමත්, ඒ මස් තම අඹු දරුවන් සමඟ උයා පිහා ආහාරයට ගැනීමත් දිනපතා සිදු විය.**

ඌරකු මරණයට පත් කිරීමට පෙර එම ඌරා කණුවක ගැට ගසා ඒ සතාගේ ශරීරයේ මස් ඉදිමීමට මෙන් ම එම මස් ඝන කිරීම සඳහා ශක්තිමත් දණ්ඩකින් පහර දෙමින් ශරීරය තලයි. ඒ සතා ශාරීරික වශයෙන් මහත් වේදනාවක් විඳියි. කටාරමක උණු කළ උණු ජලය ලෝහමය හැන්දකින් ගෙන සතාගේ මුව ඇර ඊට වත් කරයි. ලෝදිය හා සමාන එම උණු ජලය ඌරාගේ කුස තුළට වැටී කුස තුළ ඇති මළ පහ සෝදාගෙන අධෝ මාර්ගයෙන් නික්මේ. ඉන් පසු ඌරාගේ සම පහසුවෙන් ගලවා ගැනීමට ඒ උණුජලය ම ඌරාගේ පිට මතට වත් කරයි. මේ ආකාරයෙන් අපමණ වේදනා, වද දී ඌරා මරණයට පත් කරයි.

තථාගත බුදුරජාණන් වහන්සේ වැඩ සිටි වේළුවන විහාරය අසල චුන්දසූකරික තමාගේ මේ වෙළෙඳාම සිදු කරයි. තෙරුවන් වැඳීම පිදීම සඳහා බොහෝ උවසු උවැසියෝ උදේ සවස වේළුවනාරාමයට පැමිණෙති. සිල් රැකීම් ද දන් පිදීම් නිතර ම සිදු කරයි. මේ කිසිවක් චුන්දසූකර නම් සලකන්නේ නැත. දහමට, පිනට ඇදී යන ජනයා චුන්දසූකරිකගේ දෑසට පෙනී පෙනීත් ඒ ගැන සිත් යොමු නො කරයි. වේළුවනාරාමයෙන් ඇසෙන පූජා හඬ පවා ඔහුගේ කනට අමිහිරි ය. පනස් පස් වසරක් පවෙහි නියැළී ජීවත් වූ චුන්දසූකර ඒ පව්කාර ජීවිතයෙන් එක දවසක් හෝ නො මිදුණේ ය. ඔහු එම පවින් මුදා ගැනීමට ද කිසිවකුට නො හැකි විය.

චුන්දසූකරික රෝගාතුර විය. රෝගය දිනෙන් දින උත්සන්න විය. තමන් කළ දරුණු පව් සිහි විය. බියෙන් හට ගැනුණ වේදනාව ද, ශෝකය ද දරුණු බවට පත්වුණි. මේ ආකාරයෙන් දරුණු රෝගාබාධයන් සමඟ ම සිතෙහි ඇති වූ නොයෙක් කරදර අතරතුර මරණයට ළං විය. ගති නිමිති පහළ වී අවීචි මහා නිරයට එළඹ සිටියේ ය.

චුන්දසූකරික දින ගණනක් පුරා නැගූ වේදනාකාරී හඬ ඌරකුගේ වේදනා හඬ ලෙසින් ම නික්මේ. නිවැසියන්ට ද, අසල්වැසියනට ද මහා කරදරයකි. සත් දිනක් ම එසේ වේදනාකාරීව කෑගසමින් සිට මරණයට පත්ව අවීචි මහා නරකයේ උපත ලැබීය.

චුන්දසූකරගේ මරණය පිළිබඳ තථාගත බුදුරජාණන් වහන්සේට සැළ කළ අවස්ථාවේ දී උන්වහන්සේ මේ ආකාරයෙන් දේශනා කොට වදාළ සේක.

ඉධ සොචති පෙච්ච සොචති
පාපකාරී උභයත්ථ සොචති
සො සොචති සො විහඤ්ඤති
දිස්වා කම්ම කිලිට්ඨ මත්තනො

පව් කළ අය මෙලොවත් තැවෙයි. පරලොවත් තැවෙයි. අපායේ ඉපිද කම්පල වශයෙන් නිමක් නැති දුක් විඳියි.

මේ ආකාර වූ ජීවනෝපායන් තෝරාගන්නා අය අද ද නැතිවා නොවේ. එහෙත් ප්‍රාණඝාතයෙහි ආදීනව දරුණු ය. මෙවන් වූ පාප කර්මයකට ගොදුරුව අකුසල් රැස් කර, සතර අපායෙහි අවීචිය වැනි නරකයක ඉපදුණොත්, කල්ප ගණනාවක් අපමණ දුක් විඳින්ට වේ. නරක, තිරිසන්, ප්‍රේත අසුර නම් වූ සතර අපායේ ම බියකරු බව අපමණ ය.

අපි ඒ බියකරු සතර අපායෙන් ගැලවී මනුෂ්‍යයයන් බවට පත් වී සිටිමු. සම්මා සම්බුද්ධත්වය ලැබිය හැකි වන්නේ ද මනුෂ්‍යයකුට පමණි. උපතින් ලද ශරීර වර්ණය, කුලය, ජාතිය කුමක් වුවත්, දුර්ලභ වූ මනුෂ්‍ය ජීවිතයක් ලබා තිබෙන්නේ නොවේ දැයි නිතර සිහිපත් කරමු. පවින් වැළකෙමු. දහම් මාවතට ම පිවිසෙමු.

පව් කළ තැනැත්තා මෙලොවත්, පරලොවත් දෙලොව ම සොවින්, දුකින් පෙළෙන බව නිතර සිහිපත් කරමු.

**දීපා පෙරේරා**



# දරුණුතම දඬුවමක්

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටි කාලයේ සිදු වූ සිදුවීමකි. අශ්වයන් මනා කොට හික්මවන කේසී නම් තරුණයෙක් බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට පැමිණියා. උන්වහන්සේට වන්දනා කොට මෙසේ කියා සිටියා.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ පිළිබඳ මම අසා තිබෙනවා. ඔබ වහන්සේ බැහැදැක වන්දනා කරන අරමුණෙන් මම පැමිණියා.

"ඔබගේ නම කුමක්ද?"

"ස්වාමීනී මගේ නම කේසී. කේසී අස්සදම්මසාරථී" මම කෝසල ජනපදයේ සිට ඔබ වහන්සේ මුණ ගැසීමට පැමිණියෙමි.

"කේසී ඔබ අශ්වයන් හීලෑ කිරීමේ සමර්ථයෙක් ලෙසයි ඔබගේ නාමයෙන් හැඟෙන්නේ?

"එසේය ස්වාමිනි, මම අශ්වයන් දමනයට ඉතා සමර්ථයෙක්. රජතුමාගේ අශ්වයන් පවා මම මනා කොට හීලෑ කරනවා."

"කේසී ඔබ හීලෑ නො වූ අශ්වයකු මුලින් ම හීලෑ කරන්නේ කොහොමද?"

"ස්වාමීනි හීලෑ බවට පත් නොවූ තරුණ අශ්වයකු හීලෑ කිරීමට මම ඉතා මෘදු මොළොක් පිළිවෙලක් අනුගමනය කරනවා. ඒ ක්‍රමයට හීලෑ කිරීමට නො හැකි අශ්වයන් ඊට වඩා තද පරුෂ ක්‍රමයටත් හීලෑ කරන අවස්ථාවන් තිබෙනවා.

"කේසී එසේ තද පරුෂ ආකාරයට හීලෑ කළ නොහැකි අශ්වයෙක් ඔබට ලැබුණොත්?"

"ස්වාමීනි එවිට මම ඉහත ක්‍රම දෙකම අනුගමනය කර අශ්වයා හීලෑ කිරීමට උත්සාහ කරනවා."

"කේසීය, ඉතින් ඔබේ අශ්වයා එම ක්‍රම දෙක අනුව ද හීලෑ කිරීමට අසමත් වුවහොත් ඔබ අනුගමනය කරන ක්‍රියා මාර්ගය කුමක් ද?"

"භාග්‍යවතුන් වහන්ස, ඒ ක්‍රියා පිළිවෙත් දෙක අනුව අශ්වයා හීලෑ කිරීම අපහසු නම් හාත්පසින් ම වෙනස් ක්‍රියා පිළිවෙතක් මම අනුගමනය කරනවා."

"කුමන පිළිවෙතක් ද කේසී"

"මාගේ ආචාර්ය පරම්පරාවට අපකීර්තියක් වීමට ඉඩ දිය නොහැකි නිසා ස්වාමීනි මම එම අශ්වයා මරා දමනවා. එයයි මම අනුගමනය කරන පිළිවෙත"

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මම අශ්වදම්මසාරථී යනුවෙන් හඳුන්වන්නාක් මෙන් ඔබ වහන්සේ ද, පුරිසදම්මසාරථී නමින් හඳුන්වන බව මම අසා තිබෙනවා. මම අශ්වයන් දමනය කරන අයුරු ඔබ වහන්සේට පැවසුවා. ස්වාමීනි ඔබ වහන්සේ පුරුෂයන් දමනය කරන අයුරු මට පැහැදිලි කර දෙනු මැන."

"හොඳයි පින්වත, මම පැහැදිලි කර දෙන්නම්. කේසීය, මම ද ඔබ මෙන් ම මෘදු මොළොක් වචනයෙන් පුරුෂයන් දමනය කරමි. එසේ ම තද පරුෂ භාවයෙනුත් දමනය කරන්නෙමි. මෘදු මොළොක් බවින් සහ තද පරුෂ බවින් ද පුරුෂයන් දමනය කරන්නෙමි."

"භාග්‍යවතුන් වහන්ස, මම අසා තිබෙනවා ඔබ වහන්සේ ආලවක නම් රුදුරු යක්ෂ සේනාධිපතියා මෘදු මොළොක් වචනයෙන් ම දමනය කළ බව."

"කේසිය එය එසේයි. මෘදු මොළොක් ව පුරුෂයන් දමනය කිරීමට මම මෙබඳු ක්‍රියා පිළිවෙත් අනුගමනය කරමි. මම ඔවුනට අනුශාසනා කරමි. "පින්වත කාය සුචරිතය, වචී සුචරිතය, මනෝ සුචරිතය යුක්ත වුවහොත් මෙබඳු ආකාර යහපත් විපාක අත් කර ගත හැකි ය. දෙවියොත් එලෙස සුචරිතයෙන් යුක්ත වන්නාහ. මනුෂ්‍යයෝත් ඒ අයුරින් සුචරිතයෙන් යුක්ත වන්නාහ" යන මේ ආකාරයට කරුණු පහදා දෙමි."

"ස්වාමීනි ඔබ වහන්සේ තද බවෙනුත් මිනිසුන් දමනය කරනවා ද?"

"පින්වත් කේසී, කාය දුෂ්චරිතය, වාග් දුෂ්චරිතය, මනෝ දුෂ්චරිතය මෙසේ වන්නේ ය. එයින් ලැබෙන විපාකත් මෙසේ වන්නේ ය කියා මම පැහැදිලි කර දෙනවා."

"ඉදින් ස්වාමීනී යම් හෙයකින් ඔබ වහන්සේ වදාළ ක්‍රම තුනෙන් ම දමනය කිරීමට නොහැකි වුවහොත් ඉන් පසුව ගන්නා පියවර කුමක් ද?"

"එසේනම් කේසීය, මම එම පුරුෂයා මරා දමනවා"

"තථාගතයන් වහන්ස, ඔබ වහන්සේ මේ කුමක් වදාරන්නෙහි ද? බුදු බව ලැබූ උතුමන්ට ප්‍රාණඝාතය කැප නැහැ නොව."

"පින්වත් කේසී, එය සත්‍යයයි. ඉහත සඳහන් කළ ක්‍රම තුනෙන් ම එම පුද්ගලයා හදා ගැනීමට නො හැකි වුවොත්, හික්මවාගත නොහැකි වුවහොත් මම ඒ පුද්ගලයාට තව දුරටත් අවවාද නොකරමි. අනුශාසනා නොකරමි. ඔහු අවවාද අනුශාසනා නොකළ යුත්තෙක් වශයෙන් සලකා අතහැර දමමි. ඔහු ආශ්‍රය කරන අනෙකුත් බුද්ධිමත් පිරිස ද අවවාද අනුශාසනා නොකළ යුත්තකු වශයෙන් සලකා ඔහු අතහැර දමනු ඇත.

පින්වත, මම සහ මගේ ශ්‍රාවකයන් විසිනුත් කෙනකු වෙන් කිරීම, කොන් කිරීම, අවවාද නොකර අත් හැරීම ආර්යය විනයට අනුව මරා දැමීමක් වශයෙන් සැලැකෙයි. එය ආර්ය විනයට අනුව දිය හැකි බරපතලම දඬුවම වෙනවා.

"ස්වාමීනි, එසේ ය, මට වැටහුණි. ස්වාමිනි යටිකුරු කළ දෙයක් උඩුකරු කළ නියාවෙන්, අඳුරෙහි සිටියට පහනක් දැල් වූ නියාවෙන්, දෙනෙත් නොමැත්තකුට දෙනෙත් ලද නියාවෙන් සියල්ල පැහැදිලි කර ගතිමි. ස්වාමිනී, මම දිවි හිමියෙන් තෙරුවන් සරණ ගිය උපාසකයකු බවට පත් වන්නෙමි.

.

නයනා නිල්මිණී

# නැති ගුණ පෙන්වා කර ගතයුතු නැත නින්දා

බුදුරජාණන් වහන්සේ විසල්පුර මහා වනයේ කූටාගාර ශාලාවෙහි වැඩ වෙසන එක දවසක බොහෝ භික්ෂූන් වහන්සේ වග්ගුමුදා නම් ගංතෙර වස් වාසය ආරම්භ කළා.

ඒ වස්කාලය එනුවර දුර්භික්ෂයක් හට ගත්තා. එහි විසූ මිනිසුන්ට කෑමබීම ඉතා හිඟ වුණා. ඔවුන් ජීවිකාව පිණිස විවිධ රැකියාවන් තෝරා ගත්තා. සමනරු භික්ෂූන් වහන්සේ නැති සිල් පෙන්වා මම සෝවාන්ය, සකෘදාගාමිය, අනාගාමිය කියා මිනිසුන් රැවටීමට ද, තව කොටසක් ධ්‍යානලාභීන් ලෙස ද පෙනී සිටියා.

ඒ අතර වස් විසූ භික්ෂූන් වහන්සේ දුටු ඔවුන් කියා සිටියා අපට වූයේ ලාභයක්. මේ භික්ෂූන් වහන්සේලා සිල්වත් ය. කලණ දම් ඇත්තාහ ය, ගුණගරුක ය. මෙවැනි දුර්භික්ෂ කාලයක අප නොකා නොබී මව්පිය දූ දරුවන්ට ද නොදී ඉතා අමාරුවෙන් සපයා ගත් දේ ඉතා ප්‍රණීත ව පිළියෙළ කොට දන් දෙමු" කීහ.

ඒ දානය වළඳා භික්ෂූන් වහන්සේලා සුවපත් වූවා. නිරෝගි වූවා. පැහැපත් වූවා. ප්‍රසන්න මුහුණු ඇතිව ප්‍රණීතව කා බී වැඩී වස් කාලය නිමවා විසල් පුර කූටාගාරයට ගොස් බුදුරජාණන් වහන්සේ වැඳ එකත්පසව සිට මෙසේ වදාළා.

"ස්වාමීනි අප සැප සේ විසුවා. ප්‍රණීත දානය අඩු නැතිව ලැබුණා. එනිසාම අප අතර වාද විවාද ඇති වූයේ නැහැ."

"මහණෙනි ඔබලා මේ දුර්භික්ෂ කාලයේ ගම් වැසියන්ට ධර්මයෙන් අනුග්‍රහ කළා ද?"

"නැත, ස්වාමීනි, ඒ මිනිසුන් ධර්මයට සිත ඇලවූයේ නැත. අපිද මිහිරි දානය ලබා ගැනීම පිණිස නැති ගුණ ඇති බව පවසා දානය වැළඳවූයෙමු."

"හිස් පුරුෂය, ඔබලා බඩගින්නට නැති ගුණ කියා සිටියා ද? නැති සිල් පෙන්වා, ගුණ පෙන්වා දුප්පත් මිනිසුන්ගේ දානය වැළඳුවා ද? ඔබලා සිදුකර ඇත්තේ බලවත් පාපයක්. ඊට වඩා හොඳයි ඔබලාගේ කුස කපා ගත්තා නම් කුස කපා ගැනීමෙන් සිදු වන්නේ මරණය යි. නැති නම් මරණාසන්න වීමයි. එයින් නිරයට පත්වීමක් නැහැ. මහණෙනි, මෙය බරපතළ දෝෂයක්. රට වැසියා රවටා කුස පුරවා ගැනීම හේතුවෙන් නිරයේ ඉපිද කල්ප ගණන් දුක් විඳීමට සිදුවේ. එය වළකාලනු නොහැකි ය." වදාරමින් පැමිණ සිටි පිරිසට සංවේගය ඇති කරවමින් ධර්මය දේශනා කොට වදාළා.



# සුපේශල ශික්ෂාකාමී අර්ථචර්යාවෙහි පිළිපන්

## සංඝ පීතෘන් වහන්සේ

### ආචාර්ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ



**සියම් මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්ම මහා සංඝ සභාවේ බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝ නායක පූජ්‍යපාද මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමිපාණන් වහන්සේ ඍජුපටිපන්න ගුණාංගයන්ගෙන් පරිපූර්ණ වූ ආදර්ශවත් සංඝ නේතෘන් වහන්සේ නමකි.**

කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දෙහිඕවිට මුරුත්තෙට්ටුව නම් රමණීය ග්‍රාමයෙහි ජන්මෝත්පත්තිය ලැබූ උන්වහන්සේ එරත්න පතිරන්නැහැලාගේ ඒබ්‍රහම් සිඤ්ඤෝ මහෝපාසකතුමාත් ඒ.වී.පොඩිමැණිකේ මහෝපාසිකාමාතාවත් යන බොහොම ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ගුණගරුක මව්පිය දෙපළගේ තුන්වන දරුවා විය. ගමේ පාසල වූ පත්බේරිය හා දෙහිඕවිට විද්‍යාලයෙන් මූලික ගිහි අධ්‍යාපනය ලැබූ උන්වහන්සේ ගමේ පන්සලේ විහාරාධිපති හිමියන්ගේ ඉල්ලීම මත මව්පියන්ගේ ආශිර්වාදය ඇතිව සසුන්ගතවීමේ මුල්පියවර තබනු සඳහා විහාරස්ථානයට කැඳවා ගෙන ගියේ මුරුත්තෙට්ටුවේ සුධර්මාරාමාධිපති හිමියන් විසිනි. පැවිදි දිවියට ඇවැසි මූලික වත් පිළිවෙත් පුරුදු පුහුණු වූ උන්වහන්සේ කෝට්ටේ කල්‍යාණී සාමග්‍රි සංඝ සභාවේ අනුනායක පත්බේරියේ ධම්මාලෝක හිමිපාණන් වහන්සේගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් පූර්වෝපචිත පුණ්‍ය ශක්තියට අනුව මුරුත්තෙට්ටුවේ ආනන්ද යන ශාසනික නාමයෙන් සම්මා සම්බුද්ධ ශාසනයේ උත්තරීතර ප්‍රව්‍රජ්‍යාභාවය ලබා ගත්හ. අනතුරුව කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් වූ උන්වහන්සේ ප්‍රතිබල සම්පන්න ව්‍යක්ත විශාරද යතීන්ද්‍රයන් වහන්සේ සෙවණේ ශාස්ත්‍රෝන්නතිකාමිත්වයෙන් යුතුව ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබූහ. නිසි වයස් සම්පූර්ණ වීමත් සමඟ පූර්වෝපචිත කුසලශ්‍රීයෙන් විරාජමාන ව 1957 වර්ෂයේ ජුලි මස 07 වැනි දින කෝට්ටේ කල්‍යාණී සාමග්‍රි ධර්ම මහා සංඝ සභාවේ මහා නායක ධුරන්දර මොල්ලිගොඩ ආරියවංශ නාහිමිපාණන් වහන්සේගේ හා පත්බේරියේ ධම්මාලෝක නාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් සුපරිසුද්ධෝප සම්පදාවට පත්වීමට තරම් භාග්‍යවත් වූහ.

අපේ මුරුත්තෙට්ටුවේ ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ මේ රටේ වැඩ සිටින සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන මහතෙර නමකි. උන්වහන්සේ චාම් සරල ගතිපැවතුම්වලින් යුත්, නිහතමානී, ආචාරශීලී, ශ්‍රද්ධාවන්ත, ගුණගරුක, පරිත්‍යාගශීලී, අනුන්ගේ දුකේ දී අවංකවම දුක්වෙන, අනුන්ගේ සැපේ දී අවංකවම සතුටුවන පරෝපකාරය සඳහාම කැපවුණු ශාසනානුලෝමී ගුණයෙන් පරිපූර්ණ මහා යතිවරයාණන් වහන්සේ නමකි. ඉතාම පරිහානි තත්ත්වයක පැවැති නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානය සම්පූර්ණත්වයට පත්කර, ශාසනික මෙන්ම ජාතික වශයෙන් සේවාවන් ඉටුකරන ස්ථානයක් ලෙස සකස් කිරීමට හැකිවූයේ උන්වහන්සේගේ ශ්‍රද්ධාවත්, කැපවීමත්, අධිෂ්ඨානයත් නිසා බව සඳහන් කළ යුතු ය.

ජාතියේ මුරදේවතාවුන් වහන්සේ යන කරුණ හිස මුදුණින් පිළිගත් නාරාහේන්පිට ශ්‍රී අභයාරාමාධිපති හා රාජ්‍ය එක්සත් හෙද සංගමයේ සභාපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවෝ ඉපැරැණි වූ තරමට අයින් නොකර, නවීන වූ තරමට වැද්ද නොගෙන වෙනස් හා වෙනත් මගක් ගනිමින් වෘත්තීය සමිතියක් ආරම්භ කර හෙද හෙදියන්ගේ වෘත්තීය අයිතිවාසිකම් රැකදීමට ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළහ. අදටත් එම කටයුතුවල නියැළෙති. ශ්‍රී ලංකාවේ හෙද සේවයට කළ ඉමහත් මෙහෙය සමස්ත හෙද සේවයට පමණක් නොව මුළු මහත් ජනතාවට ම කළ සේවයකි. එපමණක් නොව ඒ තුළින් මුළු මහත් සෞඛ්‍ය සේවාවටත් සමස්ත වෘත්තීය සමිති ක්ෂේත්‍රයටත් කළ අනගිභවනීය සේවාවකි. රෝගී ජනතාව උදෙසා දිවියම කැප කළ උන්වහන්සේ සැමදා ජනතා ගෞරවයට පාත්‍ර විය යුත්තේ ය. අභයාරාම පුරාණ විහාරස්ථනය ඇසුරේ පුරා වසර 73 ක් අඛණ්ඩව ප්‍රදේශවාසී බොදු දරුවන්ගේ දහම් පාසල වූ ශ්‍රී සුචරිතවර්ධන දහම් පාසල තුළ ද පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන්ගේ කාර්යභාරය අතිමහත් ය. එපමණක් නොව දුෂ්කර පළාත්වල පාසල් බොහෝ සංඛ්‍යාවක් මේ වන විට ප්‍රතිසංස්කරණය කර ඇති උන්වහන්සේ විසින්ම ඒ සියලු පාසල්වල සියලුම දරුවන්ගේ වාර්ෂික පාසල් උපකරණ කට්ටල සපයනු ලැබේ. ශික්ෂාකාමී සාධු සීල ගුණයෙන් පිරිපුන් යතිවරයාණන් කෙනෙකුට අමතරව විටෙක උන්වහන්සේ කරුණාබරිත ය. සෙනෙහසින් මවක් මෙන් උණුසුම් ය. අපරිමිත රැකවරණයෙන් පියකු සේ සෞම්‍යය. විටෙක කලණ මිතුරෙකි. අයුක්තිය අසාධාරණය හමුවේ සිංහයකු ව පෙරමුණ ගන්නා උන්වහන්සේ රණවිරුවකු සේ අභීත ය. කොටි සංවිධානය පසුගිය දශක කීපය මුළුල්ලේ ශ්‍රී ලංකාවට බලවත් තර්ජනයක් විය. ඒ කාල පරිච්ඡේදයේ දී “මව්බිම සුරැකීමේ සංවිධානය” පිහිටුවා ගැනීමට උන්වහන්සේ මූලිකව ක්‍රියා කළහ. යුද්ධයෙන් අනාථභාවයට පත්, 1500 ක් පමණ ජනතාව අභයාරාම පන්සල් භූමියේ තාවකාලිකව ඉදිකළ කඳවුරුවල නවතාගෙන රැක බලා ගත්තේ ද එම “මව්බිම සුරැකීමේ සංවිධානය” මඟිනි.

> **මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ශාසනානුලෝමී හැඟීමෙන් කටයුතු කරන ලංකා ශාසනාම්භරය ආලෝකවත් කරමින් නිවැරැදි ශාසනික ප්‍රතිපදාව අනුගමනය කළ සුපේශල ශික්ෂාකාමී අර්ථ චරියාවෙහි පිළිපන් සංඝ පීතෘන් වහන්සේ නමකි.**

එමෙන්ම 1987 වර්ෂයේ දී කොටි සංවිධානය යාපනය අර්ධද්වීපය අල්ලා ගැනීමෙන් පසු නැඟෙනහිර පළාතේ සිංහලයන් සංහාරය ඇරඹිණි. එයින් අනාථ වූ සිංහල පවුල් 147 කට අයත් 747 දෙනකුට රැකවරණය සැලසුවේ ද “මව්බිම සුරැකීමේ” සංවිධානය යි.

ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට ප්‍රධාන වශයෙන් ම බලපානුයේ සංඝ සමාජය බව දත් දේශීය මෙන් ම විදේශීය බලවේගයනට නොපැකිළව, එඩිතරව මුහුණදීමට හා සංඝ සමාජය සුරක්ෂිත කිරීමට “පැවිදි හඬ” සංවිධානය පිහිටුවා ගනු ලැබුවේ ද ආනන්ද නාහිමිපාණන් වහන්සේගේ මූලිකත්වයෙනි.

ඒ වගේම අධ්‍යාපන වෘත්තිකයින්ගේ සංගමය 1988 වර්ෂයේ දී පිහිටුවාගනු ලැබුවේ ද උන්වහන්සේගේ නායකත්වයෙනි. උන්වහන්සේගේ නායකත්වය යටතේ අධ්‍යාපන වෘත්තිකයන්ගේ සංගමය නොයෙකුත් ජයග්‍රහණයන් ලබා ගත්හ.


සුනාමි ව්‍යසනයේ දී ද අසරණ ජනතාවට ශක්තියක් වෙමින් සුවිශාල කාර්යභාරයක් ඉටු කළහ.

ජනතා සම්මානයෙන් නිරතුරුව පුද ලබන උන්වහන්සේට කෝට්ටේ සංඝ සභාවෙන් “ශාසන කීර්ති ශ්‍රී” යන ගෞරව නාමය ද, විද්‍යෝදය පිරිවෙනින් “ශ්‍රී සුමංගල විද්‍යාවංශ යන ගෞරව නාමය ද පිරිනැමුණි.

මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ශාසනානුලෝමී හැඟීමෙන් කටයුතු කරන ලංකා ශාසනාම්භරය ආලෝකවත් කරමින් නිවැරැදි ශාසනික ප්‍රතිපදාව අනුගමනය කරන සුපේශල ශික්ෂාකාමී අර්ථ චරියාවෙහි පිළිපන් සංඝ පීතෘන් වහන්සේ නමකි. කිසිම අවස්ථාවක කිසිදු රජයකින් පෞද්ගලික උදව් උපකාර ලබා නොගෙන සෑම අවස්ථාවකදී ම කාලය, ධනය, ශ්‍රමය වැය කරමින් ජාතික වගකීම් ඉටු කළහ. දැන උගත් කාර්ය ශූර ජනතාප්‍රසාදයට පත් රට, දැය, සමය වෙනුවෙන් නිස්සරණධ්‍යාංශයෙන් ම මහඟු මෙහෙයක් ඉටුකරන උන්වහන්සේ ඇගයීමට ලක් කරමින් ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ පාර්ශ්වයේ අතිගරු මහා නායක ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ ගරුතර කාරක මහා සංඝ සභාව මගින් බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝ නායක ධුරය ද පිරිනැමීමට කටයුතු කළහ.




හේමමාලා රන්දුනු



# ගමයි පන්සලයි නිවනයි

**අැත ඉතිහාසයේ සිටම ගමේ කේන්ද්‍රස්ථානය වූයේ ගමේ පන්සලයි. එය ගසට පොත්තත්, පොත්තට ගසත් මෙන් එකට බැඳී පැවතුණි. මහජනතාව අතිශය ශ්‍රද්ධාවෙන්, ප්‍රඥාවෙන් සිවුපසය ( චීවර/ පිණ්ඩපාත/ සේනාසන / ගිලානප්‍රත්‍ය) භික්ෂූන් වහන්සේට පූජා කරති.**

භික්ෂූන් වහන්සේගෙන් ප්‍රත්‍යුපකාර වශයෙන් ධාර්මික ව ජීවත් වීමේ ක්‍රමවේද හා මව්පිය දූ දරු සබඳතාවේ වැදගත්කම ආදී සාරධර්ම පිළිබඳ දම් දෙසති. මෙම සම්බන්ධතාව කෙතරම් වටී ද, අගනේ ද කියා සිතා බැලිය යුතු ය.

ගමේ යම් කෙනකුට විපතක්, කරදරයක් සිදු වූ විට භික්ෂූන් වහන්සේ සෑමවිටම ආශිර්වාද හා අනුශාසනා කළහ. භික්ෂූන් වහන්සේ අසනීප වූ අවස්ථාවල ගිලන්පස, බෙහෙත් සත්කාර ගමෙන් නොඅඩුව සිදු විය. සනීපයට යෝග්‍ය පරිදි දානය සකස් විය. හැමවිටම සොයා බැලීම් කටයුතු ද සිදු කළහ. විහාරස්ථානයට, භික්ෂූන් වහන්සේට හදිසි විපතක් කරදරයක් සිදු වූ අවස්ථාවක ඝණ්ඨා නාදය ගැසූ කල ගමේ සියලු ම පිරිස එතැනට එක් රැස් වූහ.

මව්පිය සහෝදර සහෝදරියන්, නෑදෑ හිතවත් සියලු දෙනාම අතහැර දමා සිදු කරන ආගමික ශාසනික මෙහෙවර ( සේවය) උත්තරීතර පරාර්ථ සේවාවකි. හිතවත්, දායක පිරිසක් සිටිය ද ගමේ ම පිරිස දායක නාමයෙන් සැලකූහ.

පුරාතන යුගයේ පන්සලට වර්තමානයේ මෙන් නවීන පහසුකම් කිසිත් නොතිබුණි. එහෙත් ගම සහ පන්සල නොබෙදී ක්‍රමවත් ව රැකුණි. ජාති භේද, ආගම් භේද, කුල භේද, පක්ෂ භේද පන්සල තුළ අරක් ගෙන නොතිබුණි. සෑම දෙනාම උපරිම සහයෝගයෙන් , ශ්‍රද්ධාවෙන් කටයුතු කළහ. පන්සලේ වාර්ෂික ව සිදු කෙරෙන පින්කම් අතර ප්‍රධාන ම පින්කම කඨින පූජා මහ පින්කමයි. එය සෑම දෙනාගේ උපරිම සහයෝගය මැද සිදු කරති. මීට අමතරව විවිධ උත්සව, සමිති සමාගම්, ශ්‍රමදාන වැනි කටයුත්තක දී ලොකු කුඩා වැඩිහිටි සෑම දෙනාම සත්භාවයෙන් යුතුව එකතු වෙති. කටයුතු කරති. ගමේ සිදු වෙන ආගමික සමාජික හා සංස්කෘතික සියලුම කටයුතු විහාරස්ථානයේ මූලිකත්වයෙන් සිදු කෙරෙයි. දානමය පින්කම්, පිරිත් දේශනාමය පින්කම්, ධර්ම දේශනාමය පින්කම් බෞද්ධ නිවෙස්වල බහුලව දක්නට ලැබේ.

ගමේ සිදු වන අවමංගල කටයුතු මැනවින් ඉටු කරයි. එමෙන්ම උපතේ සිට ම ජීවිතයේ විවිධ සන්ධිස්ථානවල දී භික්ෂූන් වහන්සේගේ ආගමික සේවය විශේෂයෙන් අවශ්‍ය වේ. මෙහිදී ඉපදීමටත් ප්‍රථම ගැබ්බර අවස්ථාවේ දී සෙත් පිරිත් දේශනා කිරීම හා දරු ප්‍රසූතිය පහසු වීම නීරෝගි වාසනාවන්ත දරු උපතක් සඳහා අංගුලිමාල පිරිත දේශනා කරයි. දරුවා ලැබීමෙන් පසු පන්සල වෙත කැඳවාගෙන යයි. එහිදී දරුවාට සෙත් පැතීම සිදු කර ගනී. නම් තැබීම, ඉඳුල් කට ගෑම, අකුරු කියවීම, වැනි විශේෂ අවස්ථාවල විහාරස්ථානයේ ආශිර්වාදය, සෙත් පැතීම බලාපොරොත්තු වෙයි.

දරුවා ක්‍රමයෙන් වැඩීමේ දී ගෙදරට, ගමට, ප්‍රදේශයට හෙළ බිමට යහපත්, ප්‍රඥාවන්ත පින්බර දරුවෙක් කර ගැනීම සඳහා ගමේ පන්සලේ දහම් පාසලට භාර දෙයි. දහම් අධ්‍යාපනයෙන් පෝෂණය වූ දරුවා නිසි අධ්‍යාපනය ලබා කුමන හෝ වෘත්තියකට, ව්‍යාපාරයකට යාමට සූදානම් වෙන විට චරිත සහතිකය මෙන්ම පිරිත් නූල ද විශේෂයෙන් බලාපොරොත්තු වෙයි. විවාහ දිවියට එළඹීමේ දී දානමාන පින්කම් ආශිර්වාද පින්කම් සිදු කර සෙත් පැතීම ද පන්සලෙන් බලාපොරොත්තතු වෙයි.

මේ අයුරින් ජිවිත කාලසටහන ආගමානුකූලව පන්සලෙන් සිදු කර ගනී. ජිවිතයේ සැඳෑ සමය ළං වනවිට සියලු වගකීම්, බාහිර කටයුතුවලින් මිදී ආගමානුකූල පිළිවෙතක් අනුව පසුවීමට දාන, සීල, භාවනා ත්‍රිවිධ පින්කම්වලට විශේෂයෙන් කැප වෙයි. මේ භවය තුළ සිදු කළ යුතු පුණ්‍ය කර්ම, ද දූරු සබඳකම් සියල්ල නිමකර මිය යාමේ දී අවමංගල ආගමික වත් පිළිවෙත් විහාරස්ථානය මුල් වීමෙන් සිදු කර ගනී. මෙලොව පරලොව පිළිබඳ මෙනෙහි කරන සියලු දෙනාම පන්සල " නිබ්බානං පරමං සුඛං" ( නිවන පරම සැපතයි) නිවන නිවීම දකින තැනක් සේ සිතූහ. කල්පනා කළහ. විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන සිදු කරන මෙහෙවර සසර ගමන ආලෝකවත් කරන්නට හේතු වෙයි. දෛනික ජීවිතයේ දී එක්රැස් කරන සියලුම සම්පත්, මිල මුදල් එදිනෙදා ජීවිතයට පමණක් සීමා වෙයි. ඒවා තාවකාලික පැවැත්මක් පමණි. අවසානයේ දී ඒවා දැක කිසිසේත් සතුටු විය නොහැකි ය. අවසාන චුති චිත්තයේ දී ලෝභය ( ආසාව), ද්වේෂය( තරහව) , මෝහය ( මෝඩකම කුසල් අකුසල් නොදැනීම) අකුසල මූලයන් ඡවන් සිත් හරහා ගමන් කළහොත් සතර අපාය ( නරක, තිරිසන්, ප්‍රේත, අසුර) වැනි භයානක කටුක අමිහිරි ස්ථානවල ලක්ෂ කෝටි වාරයක් මැරී මැරී උපදියි. මේ බිහිසුණු ස්වභාවය භික්ෂූන් වහන්සේ නිරතුරුව ම ගමේ ජනතාවට දහම් කරුණු ඇසුරින් අතීත කතා උපමා කරමින් දම් දෙසූ සේක. නිවැරැදි ගමන් මාර්ගය පෙන්වූ අතර, වැරැදි ගමන් මාවතේ අයහපත් අකුසල විපාක ගැන ද අවබෝධයක් ඇති කරවී ය.

ශ්‍රී ලංකාවේ සැම ගමක ම විහාරස්ථානයක් දක්නට ඇත. ඒ සමඟ ම ඉරු දින දහම් පාසල් ද ඇත. ඉරුදින ද, උපකාරක පන්ති නිසා අධර්මයෙන් ළමා පරපුර මහා ආගාධයකට යොමු වී ඇත. දහම් පාසලක් ඇරඹීම සිරගෙවල් සියයක් වැසීමකි.

මේ අවාසනාවන්ත තත්ත්වයට විරාමයක් නැතිනම් දරුවන්ගේ සැලකුම් අහිමි වෙයි. එවිට ඔබට ද ජීවිතයේ සැදෑ සමයේ දී වැඩිහිටි නිවාසය, මහපාර, බස් නැවතුම්පල උරුම වෙයි.

ගම හදා රට හදමු යන සංකල්පයට අනුව මෙලොව සුබ සිද්ධිය වෙනුවෙන්, පරලොව සුබ සිද්ධිය වෙනුවෙන් ගමේ ලොකු කුඩා සෑම දෙනා ම සුමඟට ගැනීමේ ආගමික ක්‍රමවේදයක් ඇති කළ යුතු ය. දානය, සීල, භාවනාව යන යන ත්‍රිවිධ පින්කම් පුරුදු කිරීම හෙවත් එහි වැදගත්කම, දෙලොව ජය ගන්නා ආකාරය පිළිබඳ ආනිශංස දේශනා කිරීම එම පින්කම්වලට නැඹුරු කරවීමට උපදෙස් දිය යුතු ය.

පංචසීලය ජීවිත අත්තිවාරමකි. අත්තිවාරම සවිමත් නම්, චිර කාලයක් ස්ථාන ගොඩනැඟිලි පවතී. ජීවිත අත්තිවාරම සීලය නම් වේ. ධාර්මික දිවි පෙවෙත ඉතාමත් වැදගත් බව පන්සල තුළින් සාර්ථක ව පෙන්වා දෙයි.

අධාර්මික ව ධනය ඉපයීම හරි හම්බ කිරීම, මෙලොව පරිහානිය මෙන් ම පරලොව අපා දුකට හේතු වන බව අවබෝධ කරවයි. මෙලෙස පවුල් ඒකකය දැහැමිව, ත්‍යාගශීලිව කරුණාව, දයාව, මෛත්‍රියෙන් යුතු නිවැරැදි ආකාරයෙන් සකස් වන්නට පන්සලේ සම්බන්ධතාව බෙහෙවින් මහෝපකාරි වෙයි. ගම සහ පන්සල එකට බද්ධ වීම තුළ මව්පිය දෙපළ, දූ දරුවන් නිසි මඟ යහපත් ලෙසින් කළමනාකරණය වෙයි. බෝසත් පින්බර මිනිසුන්, දරුවන් හෙළබිම බිහිවෙයි.

මෙම එකමුතු බවේ අවසාන ප්‍රතිඵලය වූයේ, දැක්ම වූයේ, නිවැරැදි සාධු මඟකට බැසීම ය. එය සියලු දුක් සිඳ බිඳ දමා ලබන අමා නිවන් දොර ඇර ගැනීමයි.

මෙම දහම් කරුණු මැනවින් අවබෝධ කරගෙන ගමක ජීවත් වන්නේ කෙසේ ද? පන්සල නිවැරැදිව ඇසුරු කරන්නේ කෙසේද? අවසාන ප්‍රතිඵලය නිවන ලබන්නේ කෙසේද? යන නිවැරැදි අවබෝධය අද ලබාගෙන, හෙට දින සිට නොනිවෙන ආලෝකයක් සිය ජීවිතවල ඇති කර ගැනීමට උත්සාහ කරන්න.



මණ්ඩාවල - පුංචි මණ්ඩාවල
මල්ලිකාරාම විහාරස්ථානයේ
**කුඩාවේ
ගුණරතන හිමි**

බුදුපාමොක් මහා සංඝ රත්නයට දෙන දක්ෂිණාවට වඩා ඇසුරු සැණක් ගසන මොහොතක් අනිත්‍ය සංඥව වැඩීම උසස් අනුසස් ය. (වේලාම සූත්‍රය ඇසුරිනි)

# මහත්ඵල මහානිශංස ලැබෙන ලෙස පින් කරන්නේ මෙලෙසයි

**බිබිලේ ධම්මසිරි හිමි**

**බුදු සසුනෙහි තිසරණ සරණ ගතවූ බෞද්ධයකුට පරිත්‍යාග කරනු ලබන ඉතා ස්වල්ප වූ දනයකින් වුව ද මහත් වූ කුසලයක් ලැබෙන බවත්, ඊටත් වඩා බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට දෙන දනයෙන් ලැබෙන කුසලය මහත්ඵල මහානිසංස වන බවත්, ඊටත් වඩා අසුර සැණක් තරම් සුළු මොහොතක් 'අනිත්‍ය සංඥව" වඩනවා නම් යම් අයකුගේ එම කුසලය සියලුම කුසල් ශක්තීන් අභිබවා නැඟී සිටින්නේ යැයි, යන පණිවිඩය සන්නිවේදනය කිරීමට බුදුපියාණන් විසින් දේශනා කළ වේලාම සූත්‍රය සමත් වී ඇත.**

මහා දානමය පින්කම් පැවැත්වූ අනාථපිණ්ඩික සිටුවරයාගේ ධනය පිරිහීම නිසා අවසානයේ නිවුඩු හාලේ බතත්, කාඩි හොද්දත් පමණක් දන් දීමට සිදු විය. බුදුරජාණන් වහන්සේ සිටුවරයාට පැවැසුවේ ප්‍රණීත නොවූ දානයක් වුවත් උතුම් ශීලයක පිහිටලා, සියතින් ම සකස් කොට, ඉතා ශ්‍රද්ධා ගෞරවයෙන්, කර්මය, කර්මඵලය විශ්වාස කරගෙන සුදුසු ප්‍රතිග්‍රාහකයකුට දෙනු ලබන දානයේ ආනිසංස වැඩි බවයි.

අබුද්ධෝත්පාද සමයක දෙනු ලබන මහා දං වැටක් වුවත් එහි ආනිසංස මහත්ඵල මහානිසංස නොවන්නේ තිසරණ සරණ ගිය ප්‍රතිග්‍රාහකයකු එහි නියෝජනය නොවුණ නිසා යැයි අනාවරණය කිරීම සඳහා වේලාම බ්‍රාහ්මණයාගේ දානය ගැන ද බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

අතීතයේ දඹදිව අසූහාර දහසක් පමණ වූ රජවරුන්ගේ ආචාර්යවරයකු වූ ධනවත් වේලාම නම් බ්‍රාහ්මණ පඬිවරයා මහා දන්වැටක් පැවැත්වීය. ඔහු රජවරුන්ගේ ද සහයෝගය ලබාගෙන රිදියෙන් පිරුණ, රන් පාත්‍ර අසූහාර දහසක් ද, රනින් පිරුණු රිදී පාත්‍ර අසූහාර දහසක් ද, රන් රුවනින් පිරුණු ලෝහ පාත්‍ර අසූහාර දහසක් ද, අශ්ව රථ කිරි එළදෙනුන් ඇතුන්, අස්වයින් දාස දාසියන්, කන්‍යාවන්, අසූහාර දහස බැගින් දන් දුන්නේ ය. පංච මහා ගංගාවන් ගලන්නා සේ කෑම බීම, ඇඳුම් පැළඳුම්, මිල මුදල් ආදී භව භෝග සම්පත් ද අඩුවක් නොකොට දන් දුන්නේ ය. මෙසේ අවුරුදු ගණනාවක් දන්දීම සිදුකළ වේලාම බ්‍රාහ්මණයා වෙන කවුරුවත් නොව තමන් යැයි ද වදාළහ.

බුද්ධ ශාසනයෙහි තිසරණගත වූ, සෝවාන් මඟ පිණිස පිළිපන් බෞද්ධයකුට ආහාර වේලක් පිරිනැමීමෙන් ලබන කුසලය ඉහත සඳහන් දන්වැට පැවැත්වීමෙන් ලබන කුසලයට වඩා මහත්ඵල මහානිසංස බව අනාථපිණ්ඩික සිටුවරයාට වදාළහ.

තවද සෝවාන් ඵලස්ථ ආර්යයන් වහන්සේ කෙනකුට දෙන දාන වේල සියයකට වඩා සකෘදාගාමි කෙනකුට දෙන එක දන්වේලක් ඊටත් වඩා මහත්ඵල වන බවත් මෙසේ පිළිවෙලින් ඉහළ අනුසස් වැඩිවී ගොස් මහ රහත්, පසේබුදු, සම්මා සම්බුද්ධ යන උත්තමයන්ට දෙනු ලබන දාන පරිත්‍යාගය ඊටත් වඩා උතුම් බව වදාළහ.

මෙලෙස දාන ආනිසංස ගැන වදාරන බුදුපියාණන් වහන්සේ අවධාරණය කරන්නේ මලක් සිඹින සුළු මොහොතක් තුළ මෛත්‍රී භාවනාව වඩනවා නම්, යම් අයකු ඉන් ලබන කුසලය ඊටත් වඩා මහත් ඵල මහානිසංස වන බවයි.

තවද අසුරු සැණක් ගසන තරම් සුළු මොහොතක් අනිත්‍ය සංඥව යමකු වඩනවා නම් එහි ආනිසංස ඒ සියල්ල අභිබවා නැඟී සිටින බවයි. සෑම බුදුවරයකු ම ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව වර්ණනාකර ඇත්තේ මේ නිසා ය. අප තථාගත ගෞතම බුදුරජාණන් වහන්සේ දීපංකර සර්වඥයන් වහන්සේගේ පාදමූලයෙහි දී සුමේධ බෝධි සත්වයන් ලෙස නියත විවරණ ලබාගෙන පාරමී දහම් පූරණය කළේ ප්‍රතිපත්ති පූජාව පිණිස ය.

මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි මෙසේ සඳහන් වේ.

" යෝ ඛො ආනන්ද, භික්ඛු වා භික්ඛුනී වා

උපාසකොවා, ම පටිපන්නො ධම්මානු ධම්ම පටිපන්නෝ විහරති. සාමීචි පටිපන්නො අනුධම්මචාරි , සො තථා ගතිං සාත කරොති ගරු කරොති, මානෙති පූජෙති පරමාය පූජා පටිපත්ති පූජායි."

ආනන්දය, යම් භික්ෂුවක්, භික්ෂුණියක්, උපාසක, උපාසිකා කෙනෙක් මා වදාළ ධර්මයට අනුකූල වූ පිළිවෙතට පිළිපන්නේ වේ ද, අනුධම්මචාරි වේ ද, හෙතෙම තථාගතයන් වහන්සේට පරම පූජාව වූ ප්‍රතිපත්ති පූජාවෙන් සත්කාර කරන්නෙකි. ගෞරව කරන්නෙකි.

ඒ අනුව යම් උපාසක උපාසිකා කෙනෙක් තිසරණයෙහි. පංචශීලයෙහි, දස ශීලයෙහි පිහිටා පෙහෙවස් රකී ද, මව්පිය වැඩිහිටියන්ට උවටැන් කෙරේ ද, සිල්වතුන්ට ගුණවතුන්ට බුහුමන් කෙරේ ද, මිච්චා ආජීවයෙන් බැහැර වෙත් ද? දහමට අනුව සමථ විදර්ශනා ආදී භාවනා කර්මස්ථානයක් පුරුදු කරත් ද, ඔහු තථාගතයන් වහන්සේ අපේක්ෂා කළ ප්‍රතිපත්ති පූජාවෙහි පිහිටියේ වෙයි. ඒ බුදුපියාණන් වහන්සේගේ අවවාදයයි.

මෙසේ තථාගතයන් වහන්සේට පූජා සත්කාර කරන තාක් කල් බුද්ධ ශාසනය ද ආරක්ෂා වන බවත්, ලොව රහතුන්ගෙන් හිස් නොවන බවත් ධර්මයේ සඳහන් වේ.

මේ අනුව දාන, ශීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල නිරත වන ගිහි පින්වතුන් ගේ වැඩි අවධානය යොමුවිය යුත්තේ ප්‍රතිපත්ති පූජාවටයි. ආමිස පූජාවෙහි ම යෙදෙමින් ප්‍රතිපත්ති පූජාවල නොයෙදෙමින් ඒ කෙරෙහි වීර්ය නුවණ සිහිය නොයොදන පින්වතුන්ගේ සසර ගමන දිගු වන බවත්, සංසාර සාගරයෙන් එතෙර වී සියලු දුකින් මිදීමට නම් ප්‍රතිපත්ති පූජාව ම පුරුදු පුහුණු කළ යුතු බවත් සද්ධර්මයේ සඳහන් වේ.

උතුම් ශීලයක පිහිටා සමථ විදර්ශනා භාවනාව වහ වහා පුරුදු කිරීම දැන උගත් හුරුපුරුදු කල්‍යාණ මිත්‍රයකුගේ උපදෙස් මත කළ යුතු ය. එයින් අධි කුසලයක් තමන්ගේ ජීවිතයට එකතු කර ගත හැකි බවත්, මේ භවයේ දි මාර්ග ඵලයක් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වුවත් ඊළඟ ආත්මභවයක දී හෝ බුද්ධෝත්පාද කාලයක මනුෂ්‍ය උපතක් ලැබුවහොත් තමන් එදා පුරුදු පුහුණු කළ ප්‍රතිපත්ති පූජාමය කොටස නැවත මතු කර ගත හැකි බවත් ධර්මයේ සඳහන් වේ.

වේලාම සූත්‍රයෙන් පැහැදිලි වෙන්නේ විශාල වෙහෙසක් දරා සිදුකරන ආමිස පූජාවන්ට වඩා සැහැල්ලුවෙන් සිදුකරන ප්‍රතිපත්ති පූජාවෙන් ලබන අනුසස් මහත්ඵල බවයි.

මේ නිසා සුනාථ ධාරේථ චරාථ ධම්මෙ" යන බුදුවදනට අනුව සදැහැවතුන් නිතරම ධර්මය ශ්‍රවණය කොට සුතමය ඥනය දියුණු කළ යුතු ය. එසේ දියුණු, කිරීමෙන් අනතුරුව තමන්ට ධර්මය "ධාරෙථ" දරා ගැනීම, හෙවත් මතක තබා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමන් තුළ චින්තාමය ඥනය දියුණු වේ. මෙසේ තමන් විසින් උපයා සපයා ගත් තැන නුවණ මෙහෙයවමින් උතුම් වූ 'භාවනාමය ඥනය දියුණු කර ගත හැක.

එහෙත් අද බොහෝ පිරිස් කරන්නේ දහම් ශ්‍රවණය කිරීමත්, බොහෝවිට මතකයේ තබා ගැනීමත් පමණි. ඒ දෙකම සිද්ධ වුණාට අර්ථවත් ප්‍රයෝජනයක් සිදු නොවේ. 'චරාථ ධම්මේ" යන බුද්ධ වචනයට අනුව ධර්මය තම ජීවිතයට හුරු පුරුදු නොකරන නිසා ය.

බෞද්ධ දර්ශනය ප්‍රායෝගික දහමක් බැවින් ධර්මය තමා තුළින් දැකිය යුතු ය. 'ඕපනයික' ගුණය වන්නේ එයයි. ලෝභ, ද්වේශ, මෝහ තමන් තුළ පවතින ධාරිතාවය භාවනාමය ඥානය දියුණු කිරීමෙන් යෝගාවචරයකුට අවබෝධ කළ හැකි ය. මේ සඳහා භාවනාව දියුණු කළ යුතු ය.

රේරුකානේ චන්දවිමල ස්වාමීන් වහන්සේගේ පොතක මෙසේ සඳහන් වී තිබුණි. "විශාල ගසක් මුදුනේ ඉදුණු පළතුරු ගෙඩියක් තිබුණි. එය ආහාරයට ගැනීම සඳහා කුරුල්ලකු ද සිටී. එහෙත් ඒ කුරුල්ලාගේ තටු (පියාපත්) නැති නිසා ගස උඩ තියෙන ගෙඩියට ළඟාවීමට නොහැකි ය . මේ කුරුල්ලාට පියාපත් තිබුණා යැයි සිතමු. නමුත් අර පලතුරු ගෙඩිය ළඟට ගියාට ගෙඩිය අනුභව කිරීමට සුදුසු හොටයක් හෙවත් තුඩක් නැත. එසේ නම් ගෙඩිය කෑමට නම් තුඩත් තිබිය යුතු ය. මේ අනුව නිවන් දැකීමට උත්සාහ දරන පින්වතුන්ට පින නැමැති තටුත් තිබිය යුතු ය. ප්‍රඥව නැමති තුඩත් තිබිය යුතු ය. එසේ නම් ආමිස පූජාවත්, ප්‍රතිපත්ති පූජාවත් යන දෙකම නිවනට අවශ්‍ය බව ඉන් කියවේ.





## පොසොන් සඳ

එ පුන් පොසොන් සඳ දින
අනුබුදු මිහිඳු මහ රහත් සඳ
වැඩි සේක බබළන මිහිතලා මත
මහා නිරිඳු දෙවන පෑ
දරා දුනු හී සොයා මුව හද
ගමන වී තුටු සිතින
මහා රහත් මිහිඳු සඳ
දෙසුව සුමිහිරි දහම් හඬ
සවන වැද මහා නිරිඳු
පැහැද සිත් සතොසින
අතැර දුනු හී
සරණ වී තෙරුවන........

සිය දහස් සිව් දෙස
මහා දන සිත් පබෝධ ව
සවන වැද මිහිරි දම් රස
දුරුව හද රැඳි අඳුරු සිතිවිලි
දනන් යන දහමෙ මඟ

ඉදිව මහා වැව් ගලන දිය බිඳු
පිරි නිල් දිය හද තෙමාලන
සිනාසෙන රන් කෙත් ද තුරුලිය
මහා දා ගැබ් වෙහෙර පින් බිම්
පිදුව සසුනට බැතිබර,
අනුබුදු මිහිඳු මහා රහත් සඳ
දෙසුව දම් හඬ එදා මිහිතල
සුවඳ ගලනා ගඟක් වී
මෙසිරිලක සිත් සනසනා,
සිහිකර උතුම් පොසොන් සඳ දින
පුරමු පිළිවෙත් දැහැමි මඟකට......

**නීතිඥ කීර්ති කපුවත්ත**
**රිදීගම**



## වෙසක් පොහෝදා

තෙමඟුල සමරමින් බුදුගුණ ගයන්නට
තෙමඟුල දිනේ දොහොතින් මල් පුදන්නට
තෙමඟුල අසිරි මුළු ලොවට ම බෙදන්නට
ඇරයුම් කරමි හැමටම මෙත් වඩන්නට

තුන් ලෝ තිලක වූ සම්බුදු පියාණෙනි
තෙමඟුල් දිනය මම සමරමි දයාවෙනි
ඒ අසිරිමත් දිනයෙහි මෙත් අමා පැණී
සිසිලස ගෙනේවා හැමගෙම නිවා ගිනී

තෙමඟුල් දිනේවත් අද අපි පව් නොකර ඉමු
වෙනදට වඩා අදවත් පන්සිල් රකිමු
පුළුවන් තරම් දන් පැන් පූජා කරමු
තුන් හිතකවත් වයිරය ඇති කර නොගමු

අම්මගෙ තාත්තගෙ දුක සැප විමසන්න
වැඩිහිටි අයට කනබොන දෑ සපයන්න
නැති බැරි අයට මිල මුදලින් සලකන්න
පොත පත නැති අයට පොත් අරගෙන දෙන්න

බුදු සමිඳුන්ට මල් පහනින් පුදන්න
පසඟ පිහිටුවා දෙගුරුන් වඳින්න
ගෙදර මිදුල අතුපතු ගා දමන්න
වෙසක් කූඩුවක් ගෙදරදී හදන්න

**නුගවෙල පුරාණ විහාරයේ**
**කෝන්වැවේ සිරිසුමන හිමි**

## අහිමි වීම

කරුණා දයා පතුරා මෙත් පිරුණු සරින්
දෙසනා දම් අසා අප සම්බුදු හිමියන්
හිටියා නමුත් කොනකට වී විපිළිසරින්
හිතකට නොදැනුනේ දම් රස මගෙම පවින්

කිසාගෝතමී මළ දරු වඩාගෙන
ආවිට පසුව අබ මිටක දු නොමැති තැන
ඉන්නැති මමත් අසලින් බණ අසාගෙන
ගෝතමී නිවන්පුර මම තාමත් මෙතැන

උන්මාදයෙන් නිරුවත් වී හිමි දෙසට
දිවගිය පටාචාරා සැනසුණි යසට
හිටියත් දම් අසාගෙන වීලා කොණට
පිහිටක් නොලැබුණේ ඇයි මාගේ දුකට

භවයෙන් භවය මේ දුර ආවත් සසර
දන් සිල් භාවනා සිත වැඩුවත් නිතර
යන්නට හිතන මුත් දිගු සසරින් එතෙර
පලිබෝධයන් මඟ අහුරයි නිරන්තර

මහ කරුණා නෙතින් මා නුදුටුවෙ මන්ද
පෙර කළකුසල් නැති බව හිමි දුටුවෙහි ද
සසරේ දුක විඳින්නට ඉතිරිව ඇතිද
ගෞතම බුදු සසුනෙ මට සැනසුම නැතිද

**රූපා ගජධීර**
**නො.3, කුඩමාදුව**





## උපහාරය

පිළිම ගෙයට පිවිසෙන මඟ
පියගැට පෙළ පාමුල මැද
අඩ කවයක ගල් තලාව
'සඳකඩ පහණ ය' නම් ලද
ඉහළ කලා නිමැවුමක් ය

ඇත් අස් ගව සිංහ රූප
තුඩ'ග මල'ති හංස රූප
මල් ලියවැල් පලාපෙති ද,
උතුම් 'නිවන' අරුත ගෙනෙන
සුපිපුණ නෙලුමකි මැදින්

බොදු හැඟුමින් පිරි මනසින්
දළ දඬු ගල ඔප දමමින්
අග මුල නිම නැති භව මඟ
පිළිබඳ ලොව දැනුවත් කල
බොදු සසුනෙහි අරුම කියයි

තණ්හා ආශා දුරු කර
සොබා දහම වෙත ලංවුණ
සිනිඳු සිතක ජනිත මිහිරි
අති විසිතුරු කලා හැඟුම
මවිත කරයි ලොව හැම දෙන

සසර දුකින් තැවෙන පෙළෙන
මිනිස් මනස සනහා ලන
අමිල දසුන ගලක නෙළුවෙ
කවුරු ද ඔහු, කලා රජෙකි
ඔහුට අපේ උපහාරය!!

**ආචාර්ය ස්වර්ණා**
**විජේසිරිවර්ධන**
**සමරවික්‍රම**
**ශ්‍රී නන්ද ජෝතිකාරාම මාවත**
**තලවතුගොඩ**

## කෙලෙස් ගින්නෙන් නොදැවෙන මඟ

කෙලෙස් ගින්නෙන් දැවී යා නම්
කුමට මේ ලොව හිනැහිලා
දැවෙන ගින්නෙන් නොදැවෙනා
මඟ
බුදු මුවින් ඇසුවා........

උපන් අකුසල් දුරින් දුරු කරවා
නොඑන්නට
මඟ වසා දමලා
තබන්නට
කුසල් රැක හිඳුවා
මිදෙන මඟ දෙසුවා.

බවුන් වඩමින් සිතින් සිත නිවලා
හිඳින්නට
සුවෙන් සැනසීලා
ලබන්නට
නිවන් මඟ පාදා
දහම් පැන් පෙව්වා....

**බණ්ඩාර අදිකාරි**
**ගාල්ල**



## දැකීම

මහ මලුව මත වැතිර හිස තබා නමදින්නේ
බෝ ගසක් පිළිමයක් දකිනවිට නැඟිටින්නේ
දානයක් පින්කමක් ඇති තැනට දන් දෙන්නේ
ඉල්ලුවොත් හිඟමනක් නැති බවයි හඟවන්නේ

බුදුන් දෙසු ධර්මය ම උතුම් කොට සලකමින්
නොයෙක් වූ වැදි බණට සැමවෙලේ හිත තියන්
තම හිත ම තමන්ට ම උපමාව කරගමින්
සසර කතරින් එතෙරට මිදෙන්නට වෙරදරන්

**ගාමිණී ජයලත් තල්දෙන**
**හාලිඇල**

## පහන් සිතක කවි



සංස්කරණය
**දීපා පෙරේරා**

## රූපයෙහි කෙළවර

රූ සිරින් සපිරුණු සුකුමාල නර්තනය
පෙන්වීය සිදුහත්ට සැබෑ වූ විරූපය
නර්තනය පියකරු ය කෙළවරට විනාශය
පසක්විය නෙත් වෙතට අමුසොහොන් දර්ශනය

**කිතුල්ගල**
**රත්නසේකර රූපසිංහ**

### බුදුසරණ පහන් සිතක කවි

BCC


සම්පූර්ණ නම :- ..............................................................
ලිපිනය :- ..............................................................
දුරකථන අංකය :- ..............................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

# සිංහලයන් සතු රාජධානිය නැවත අත්පත් කර ගත යුතුයි

## දුටුගැමුණු මහ රජතුමා

69 කොටස



"රාජ දූතය, සාමය සඳහා සන්දේශයක් ද"

"නැත, දේවයන් වහන්ස"

"එසේ නම් සන්දේශය කුමක් සඳහා ද?"

බඤ්ජදේව, රජතුමා වෙත ගොස් ආචාරශීලීව තමා වෙත තිබුණු තල්පත එළාර රජුට දුන්නේ ය.

"මහ රජතුමනි, සිරිනාග නම් මහසෙනෙවියකු කසාතොට දී අත්අඩංගුවට ගෙන මාගමට එවා තිබේ. සන්දේශය ඔහු වෙනුවෙනි."

රජු තල්පත ගෙන කියවීය. කෝපයට පත් මුහුණින් යුතුව එය දීඝජන්තුට දුන් රජතුමා බැලුවේ දීඝාභය දෙස ය. දීඝජන්තු කාටත් ඇසෙන්නට තල්පත කියවීය. කෝපය ඔහුගේ මුහුණෙන් ද පෙනෙන්නට විය. සභාව වික්ෂිප්තව බලා සිටියේය.

නිශ්ශබ්දතාව බිඳිමින් දීඝාභය කතා කළේ බඤ්ජදේව දෙස බලමිනි.

මහ රජතුමනි, මේ සන්දේශය ගෙනැවිත් තිබෙන්නේ මාගම රාජ්‍යයේ මහ සෙනවියකු හෙයින්, සාර්ථක පිළිතුරක් දුටුගැමුණු රජතුමා අපේක්ෂා කරන බව පෙනේ.

සිරිනාග ලෙහෙසියෙන් අත් අඩංගුවට පත් වන්නෙක් නොවෙයි. සිරිනාග අපට එවා ඇති තල්පත අනුව ඔහු සිරභාරයට පත් වූයේ අපේ ම ඔත්තුවක් අනුව බව පැහැදිලියි. ඔහු ඉතා දක්ෂයෙක්.

දැනට මෙහි සිරබාරයේ සිටින චර පුරුෂයන්ගෙන් අපට වැඩක් නැති හෙයින් ඔවුන් නිදහස් කර යවා සිරිනාග මහ සෙනෙවි මෙහි ගෙන්වා ගැනීම ප්‍රයෝජනවත් බවත්, එසේම අපේ යුතුකමක් බවත් මගේ අදහසයි."

දීඝාභය කීවේ යෝජනාවක් ස්වරූපයෙනි. ඉන්පසු ඔහුගේ අවධානය යොමු වූයේ දීඝජන්තු වෙත ය.

"එහෙමයි, දේවයන් වහන්ස, සිරිනාග මෙතෙක් අපට කර ඇති සේවය අනුව ඉදිරියේ දී ලබා ගත හැකි මෙහෙය අනුව ඔහුට මරණ දණ්ඩනය ලැබෙන්නට ඉඩ නොහළ යුතු බව මගේ අදහසයි.

රාජ සභාව එය ඒකමතිකව අනුමත කළේ ය. රජතුමා ඒ පිළිබඳ තුණ්ඩිලගෙන් ප්‍රශ්න කළේ ය."

"තුණ්ඩිල, දැනට අපේ සිරභාරයේ සිටින චර පුරුෂයන්ගේ සංඛ්‍යාව කොපමණ ද?"

ඔහු පිළිතුරක් නොදී බලා සිටියේ ය. දීඝ ජන්තු දෙස බලා නිශ්ශබ්ද විය. එහෙත් රජුගේ තියුණු බැල්ම හෙයින්, බඤ්ජදේව දෙස බැලූ ඔහු දුන්නේ කපටි පිළිතුරකි.

"දේවයන් වහන්ස හැට දෙනකුට වඩා නැහැ" "මහ රජතුමනි, අපගේ දැනීමේ හැටියට දැනට සිර අඩස්සියේ සිටින චරපුරුෂයන්ගේ සංඛ්‍යාව එකසිය තිස්පහක්. ඒ සියලු දෙනාම නිදහස් කර ගැනීම අපේ දූත කාර්යයේ අරමුණයි."

එළාර රජතුමා විමතියට පත්ව බඤ්ජදේව දෙස බලා සිටියේ ය. දීඝජන්තු පුදුමයට පත්විය. සෙනෙවිවරු සියලු දෙනා ද පුදුමයට පත් වූයේ මෙම ආගන්තුක දූතයාගේ ප්‍රකාශයෙනි.

"තුණ්ඩිල, මේ රාජ දූතයා කියන්නේ ඇත්තක් ද?"

ඔහුගේ පිළිතුරක් නැත. දීඝජන්තු ඒ වෙනුවට පිළිතුරු දුන්නේ ය.

"එසේ ය, මහරජතුමනි, ඔහු ඉදිරිපත් කරන සංඛ්‍යාව නිවැරැදියි. එහෙත් ඔහු එය දැනගත්තේ කෙසේද යන්න දැන ගැනීම අපට වැදගත් විය හැකියි. අපේ රහස් මෙතරම් සියුම් ලෙස මොවුන් අතට පත් වෙන්නේ කෙසේද?"

"එය දැන ගත යුත්තේ නුඹ ම නොවේද? මහසෙනෙවි" රජතුමා කෝපයෙන් විමසුවේ ය.

දේවයන් වහන්ස, මොහු මට පවරනු මැනවි. හෝරාවක් ගත වන්නට කලින් ඒ සියල්ල මට මොහුගෙන් දැනගත හැකියි.

එළාර රජතුමා තුණ්ඩිල දෙස රවා බැලුවේ ය. සභාවේ ද නොසන්සුන් බවක් දිස්විය.

තුණ්ඩිල, නුඹ තමන් දරන සෙනෙවි තනතුරටත් නොබියව කතා කරන්නේ කෙසේදැයි මට පුදුමයක්. රාජ්‍යයකින් තවත් රාජ්‍යයකට එන රාජ දූතයකුට ඔහු ගෙන එන සන්දේශය යහපත් වුවත්, අයහපත් වුවත්, එය ඉටු කළ හැකි වුවත්, නොහැකි වුවත් ඔහු ඉහළින් පිළිගෙන ආගන්තුක සත්කාර කර අපේ පිළිතුර සමඟ බාධාවකින් තොරව ආපසු යැවීම රාජ සම්ප්‍රදාය බව නොදන්නේ ද? රාජ නීතිය හෝ ආචාරධර්ම හෝ නොදන්නා තොපට මහ සෙනෙවිකමක් පැවරිය හැකි ද?

රජ දූතය, මෙහි සිරගතව සිටින සියලුම චරපුරුෂයන් තොපේ රජතුමා අපේක්ෂා කරන පරිදි, මෙයින් සිව්වැනි දින පෙරවරුවේ කසාතොටේ දී උපතිස්ස බණ්ඩාර සෙනෙවියාට භාර ගත හැකියි. එම මොහොතෙහි සිරිනාග මහ සෙනෙවි ද අපේ මහ සෙන්පති දීඝජන්තුට භාර දිය යුතු බව තොපේ රජතුමාට සැළ කරව"

"හොඳමයි, මහ රජතුමනි, ඔබ වහන්සේගේ නියමය පරිදි ඒ සියල්ල එලෙසම සිදුවනු ඇති."

බඤ්ජදේව මහ සෙනෙවි, රජතුමාට ආචාර කර සම්මන්ත්‍රණ ශාලාවෙන් පිටතට පැමිණියේ ය.

කසාතොටින් පැමිණි ආරක්ෂක සෙනෙවිවරුන් දෙදෙනා ඔහු දෙපස සිට ගත්තේ ය. සම්මන්ත්‍රණ ශාලාවේ මුර කොටුව වෙතට ගිය ඔවුන් තිදෙනා තම අශ්වයන් පිට නැඟී ගමන ආරම්භ කළෝ ය."

"සෙනෙවිවරුනි, ශ්‍රී මහා බෝධින් වහන්සේ වෙතට ගොස් වැඳ පුදා යන්නට ඇත්නම් මම කැමතියි."

"ඔව්, ඔබට එය කළ හැකියි. ඒ සඳහා වෙනම අවසරයක් අවශ්‍ය නැහැ.

ඔවුහු ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙත පැමිණියහ. බෝමලුව අසල අශ්වයා නවතා එහි ඇතුළු වූ බඤ්ජදේව මහත් භක්තියෙන් බෝධීන් වහන්සේ වැඳ පැදකුණු කොට පිටතට පැමිණෙත් ම දුටුවේ, රූමත් තරුණියන් තිදෙනෙකි.

දන්ති කුමරිය, බඤ්ජදේවගේ සිතට සතුටක් නැගිණි. දන්ති ද ඔහු දෙස පුදුමයෙන් බලා සිටියා ය. ඔහු තමන් අමතන්නට පෙර ඇය කතා කළා ය.

බඤ්ජදේව, මහ සෙනෙවි තුමනි, ඔබ මෙහි පැමිණියා ද? මාගමින් රජ දූතයකු පැමිණ සිටින බව දැන ගත්තා. එහෙත් ඒ ඔබ බව දැන සිටියේ නැහැ."

"මම රජගෙදර සේවිකාවක්. ඒ නිසා කතාකරන විට පරිස්සම් වන්න." සෙමින් කී ඇය තමන් සමඟ සිටි අනෙක් තරුණියන් දෙදෙනා හඳුන්වා දුන්නා ය."

"මේ එළාර මහරජතුමාගේ එකම දියණිය අභිකෲෂ්ණා කුමරිය. මේ පුණ්ණා, එතුමියගේ යෙහෙළියක්. ඉතින් මහ සෙනෙවිතුමනි ඔබ පැමිණි කාර්යය සාර්ථකව ඉටු වුණා ද?

ඔව්, අපේ අත්අඩංගුවට පත්ව සිටින සිරිනාග මහ සෙනෙවි නිදහස් කර එවීමට මෙහි සිරගතව සිටින සියලුම චරපුරුෂයන් නිදහස් කරන ලෙස අප කළ ඉල්ලීම එළාර මහ රජතුමා පිළිගත්තා."

"දන්ති, අපි සිතුවේ ගැමුණු රජතුමා මේ දූතයා එවූයේ සාම සාකච්ඡාවට කියලයි. එහෙත් දැන් බලනකොට යුද්ධයේ වෙනසක් වෙන්නේ නැහැ."

"ඔව් කුමරියනි, මේ රාජධානිය සිංහලයන් සතු එකක්. එය නැවත අත්පත් කර ගැනීමේ සටන ළඟදීම ආරම්භ වේවි."

"මහ සෙනෙවිතුමනි, එය සාධාරණ සටනක් තමයි. නමුත් සටනකින් තොරව මෙය විසඳා ගන්නට බැරිද?

"ආක්‍රමණික ස්වරූපයෙන් පැමිණ සිටින සියලු දෙනාම මේ රටින් පිට වී අනෙක් සියලු දෙනාම සිංහල ආධිපත්‍ය පිළිගන්නේ නම් සටනක් අවශ්‍ය නැහැ කුමරියනි."

කුමරියට පිළිතුරක් දෙන්නට අවස්ථාවක් නොලැබිණි. එතැනට කඩා වැටුණේ තුන්ඩිල ය. රජ කුමරිය දැකීමෙන් උද්දාමයට පත් ඔහු ආරක්ෂක සෙනෙවිවරුනට බැණ වැදුණේ ය.

"මොහු කසාතොටට රැගෙන ගොස් ගඟින් එතෙර නොකොට මෙහි රඳවාගෙන සිටින්නේ කාගේ අවසරයකින් ද?

සෙනෙවිතුමනි, මේ මහ සෙනෙවිතුමා ශ්‍රී මහා බෝධිය දැක බලා ගැනීමේ කැමැත්ත පළ කළා. ඒ නිසා මෙහි එන්නට සිදු වුණා. දැන් අප සූදානම් වූයේ කසා තොටට ගමන් අරඹන්නටයි."

ඉතින් මේ තරුණ කාන්තාවන් සමඟ ඔහුට ඇති කතාව කුමක්ද?

තුණ්ඩිල, සෙනෙවිතුමනි, මේ මහ සෙනෙවි තුමා මා දන්නා හඳුනන කෙනෙක්. ඒ නිසා මමයි ඔහුගෙන් තොරතුරු විමසුවේ" දන්තී කීවා ය.

අයන්ති විතාන

වර්ෂ 2022 ක් වූ ජුනි 21 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.